# කතිරයේ බලය

වෙළුම 2 කලාපය 2 මැතිවරණ කොමිෂන් සභාව මැයි - අගෝස්තු 2018

## සංස්කාරක සටහන

මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 සිවු අවුරුදු උපාය මාර්ග සැලැස්ම අනුව මැතිවරණ කොමිෂන් සභාව විසින් හඳුනාගන්නා ලද ප්‍රධාන අවධාරිත ප්‍රදේශ (Trust areas) හතරකි. මෙම අවධාරිත ප්‍රදේශ යටතේ අරමුණු (Goal) හතක් හඳුනාගන්නා ලද අතර ඉන් ප්‍රධාන අරමුණක් වූයේ සුදුසුකම් ලත් සියලු පුරවැසියන් ඇතුළත් වාර්ෂික ඡන්දහිමි නාමලේඛනයක් සකස් කිරීමයි. පූර්වයෙහි මැතිවරණ දෙපාර්තමේන්තුව ස්ථාපිතව පැවති කලද වාර්ෂික ඡන්දහිමි නාමලේඛනය සැකසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අරමුණක්ව පැවතිණ. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක මහජන නියෝජිත ආයතන සඳහා පාලකයන් තෝරා පත්කර ගන්නේ ජනතාවගේ ඡන්ද බලයෙනි. ජනතාව සතු පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ඡන්දහිමි නාමලේඛනයේ ස්වකීය නම් ඇතුළත්ව තිබීම අනිවාර්යෙන්ම සපුරාලිය යුතු අවශ්‍යතාවකි.

ඒ අනුව සුදුසුකම්ලත් සියලු පුරවැසියන් වාර්ෂික ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විවිධ වැඩසටහන් ව්‍යාපෘතීන් ක්‍රියාවට නංවන අතර, 2012 වර්ෂයේ සිට සෑම වර්ෂයකම ජූනි 01 දින ඡන්ද හිමියන්ගේ දිනය ලෙස නම් කොට ලංකාවම ආවරණය වන පරිදි පුළුල් ප්‍රචාරාත්මකව ඡන්ද හිමියන් දැනුම්වත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. එක් එක් වර්ෂය සඳහා විවිධ වූ තේමාවක් මුල්කොට ගෙන ක්‍රියාත්මක කරන ලද මෙම ඡන්ද හිමියන්ගේ දින සැමරුම වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලියට ප්‍රදීපස්ථම්භයක් විය. ලංකාව පුරා ජීවත්වන සියලුම ජනකොටස්, රාජ්‍ය නිලධාරීන්, දේශපාලන අධිකාරිය, පාසල් ශිෂ්‍ය ප්‍රජාව, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා ජනමාධ්‍ය ආයතන ආදී කොමිෂන් සභාවේ සියළු පාර්ශවකාර ආයතන වාර්ෂික ඡන්දහිමියන්ගේ දිනය සැමරුමට එක්වෙති. මෙම පුළුල් දැනුම්වත්වීම නිසා වාර්ෂිකව ඡන්ද දායකයන්ගේ වර්ධනයක් පෙන්නුම් කරන අතර ඒ තුළින් උපායමාර්ග සැලැස්මෙහි දක්වා ඇති ඉලක්ක සපුරා ගැනීමට හැකිවී තිබේ.

එබැවින් සුදුසුකම්ලත් සියළුම පුරවැසියන් වාර්ෂික ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කර ගැනීමේ අභියෝගාත්මක අරමුණ සාර්ථක ලෙස ජයගැනීම සඳහා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන්, ව්‍යාපෘති අතරට කොමිෂන් සභාවේ කාර්තුමය ප්‍රකාශනයක් වූ "කතිරයේ බලය" පුවත් සඟරාවට ද දායකවන්නට ලැබීම ඉතා කාලෝචිත අවස්ථාවක් බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.

ඒ අනුව මෙවර කතිරයේ බලය පුවත් සඟරාවට විෂය මූලික වූයේ වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලියට අදාළව පුළුල් අත්දැකීම් සහිත විද්වත් මණ්ඩලයක් විසින් සම්පාදනය කරන ලද ලිපි සහ ඡන්ද හිමියන්ගේ දින සැමරුම් ඇතුළත් ඡායාරූප සමූහයකි.

මෙම සත්කාර්යය සඳහා ස්වකීය දැනුම, කාලය හා ශ්‍රමය කැප කළ සියලුම සුධීහු කොමිෂන් සභාවේ නොමඳ ගෞරවයටත් බුහුමනටත් පාත්‍රවූවෝ වෙති.

- සංස්කාරක

## ලංකාවේ ඡන්දහිමියන් ගණන් ගැනීම හා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ විකාශනය

පී.එම්.සිරිවර්ධන
විශ්‍රාමික අතිරේක මැතිවරණ කොමසාරිස්

### හැඳින්වීම

ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක දී මහජන නියෝජිත ආයතනවලට නියෝජිතයින් තෝරාපත් කිරීමේ බලය හිමිවන්නේ, ඡන්ද බලය හිමිවන තැනැත්තන්ට පමණි. ඡන්ද බලය, රටක ජනතාවගේ මූලික අයිතිවාසිකමක් ලෙස ද සැලකෙන බැවින් එය, රටක මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විග්‍රහ කිරීම සිදු වන අතර, ඊට අදාළව වෙනත් නීති සංග්‍රහ ද තිබෙනු ඇත.

මැතිවරණ අවස්ථාවක දී ඡන්ද බලය හිමිවන තැනැත්තන් හඳුනා ගැනීම, ඡන්දහිමියන්ගේ නාමලේඛනයක් මගින් සිදු වේ. නීතියක් අනුව එම සුදුසුකම් ලබන අය පිළිබඳව සොයා බලා ලියාපදිංචි කිරීම අදාළ බලධාරීන් විසින් සිදු කෙරේ.

### 02. ලංකාවේ ඡන්දහිමියන් ගණන් ගැනීමේ නීති

**(01) වර්ෂ 1910 සිට 1929 දක්වා ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභා අවධිය**

අ. 1910 අංක 13 දරන ආඥා පනත
ආ. 1920 ලංකා (ව්‍යවස්ථාදායක සභාව) රාජ මණ්ඩල ආඥාව
ඇ. 1923 ලංකා (ව්‍යවස්ථාදායක සභාව) රාජ මණ්ඩල ආඥාව

**(02) වර්ෂ 1930 සිට 1945 දක්වා රාජ්‍ය මන්ත්‍රණ සභා අවධිය**

අ. 1930 ලංකා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා) (ඡන්දහිමියන්ගේ නාමලේඛනය) රාජ මණ්ඩල ආඥාව
ආ. 1931 (රාජ්‍ය මන්ත්‍රණ සභා) රාජ මණ්ඩල ආඥාව

**(03) මහජන මන්ත්‍රී මණ්ඩලය හා පාර්ලිමේන්තු අවධිය**

අ. 1946 ලංකා (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා) රාජ ආඥාව
ආ. 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ ආඥාව
ඇ. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ඈ. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
ඉ. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත

### 03. මැතිවරණ නීති මගින් ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමට අදාළව ආවරණය වන ප්‍රධාන ක්ෂේත්‍ර

i. ඡන්ද බලය සඳහා සුදුසුකම්
ii. මැතිවරණ කොට්ඨාස
iii. ලියාපදිංචි කිරීමේ නිලධාරීන් පත් කිරීම හා ඔවුන්ගේ කාර්යයන්
iv. ඡන්ද බලය හිමිවන තැනැත්තන්ගේ තොරතුරු රැස් කිරීම.
v. ඡන්දහිමියන්ගේ තොරතුරු මත සකසන ලද මූලික ලේඛන මහජනයා වෙනුවෙන් ප්‍රදර්ශනය කිරීම.
vi. මූලික ලේඛනය මත හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීමට අවකාශය සැලසීම.
vii. හිමිකම් හා විරෝධතා පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම.
viii. එම පරීක්ෂණ පිළිබඳ තීරණ සම්බන්ධ අභියාචනා ඉදිරිපත් කිරීම.
ix. ප්‍රතිශෝධන නිලධාරීන්
x. නාමලේඛනය සහතික කිරීම.
xi. නියමිත කාලයකට වරක් නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම.

### 04. ඡන්ද බලය සඳහා සුදුසුකම්

ඡන්දහිමියෙකු වීම සඳහා සාමාන්‍යයෙන් පුද්ගලයාගේ පුරවැසිභාවය, සුදුසුකම් ලැබීමේ වයස, පුද්ගලයාගේ යහපත් මානසික සෞඛ්‍ය තත්ත්වය, මැතිවරණ කොට්ඨාසය තුළ පදිංචිය හා නීතියේ සඳහන් ආකාරයට අධිකරණයකින් වරදකරුවකු නොවීම ආදී කරුණු සුදුසුකම් වශයෙන් බොහෝ රටවල් පාදක කර ගන්නා බව පෙනේ. ලංකාවේ ද ඡන්ද විමසීම් ඇරඹි කාලයේ සිටම ඡන්දහිමියන්ගේ සුදුසුකම් තීරණය කිරීමට නීතිය මගින් මෙවැනි කාරණා සැලකිල්ලට ගෙන ඇති බව අදාළ නීති පරීක්ෂා කිරීමේ දී පෙනී යයි.

වර්ෂ 1910 සිට 1929 දක්වා ව්‍යවස්ථාදායක සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් කොටසක් පමණක් ඡන්දයෙන් තෝරාගත් අතර, සෙසු අය නිලධාරී තනතුරු අනුව හා ජාතීන් නියෝජනය වන ආකාරයට ආණ්ඩුකාරවරයා විසින් තෝරාපත් කර ගනු ලැබිණි. 1911 වර්ෂයේ දී ඡන්දයෙන් තෝරා ගත් සිවුදෙනා, 1920 දී දහසයක් හා 1923 දී විසිනවයක් දක්වා වැඩි විය.

1911 දී මැතිවරණ කොට්ඨාස හතරකින් ජාතීන් තුනකට අයත් නියෝජිතයින් තෝරා ගැනීමට නියම වූ අතර, යුරෝපීය, නාගරික හා ග්‍රාමීය යන කොට්ඨාස දෙකේ පමණක් ඡන්දහිමියන් වීමට පුද්ගලයන් විසින් සැපිරිය යුතු සුදුසුකම් සමාන විය. බර්ගර් මැතිවරණ කොට්ඨාසය, 1786.02.15 දිනට බර්ගර් ජාතිකයෙකු වූ අයෙකුගෙන් පැවත එන ලන්දේසීන්ට සීමා වූ අතර, සෙසු කොට්ඨාසය වූ ලාංකික මැතිවරණ කොට්ඨාසයේ මෙරට සිංහල, දමිළ හා මුස්ලිම් ජාතිකයන්ට ලියාපදිංචියට ඉඩ ලැබුණි. යුරෝපීය නාගරික කොට්ඨාසය, කොළඹ, ගාල්ල හා මහනුවර යන මහනගර සභා බල ප්‍රදේශ තුනට සීමා වුව ද, සෙසු කොට්ඨාස තුනම මුළු දිවයිනටම පොදු විය. මෙකල ඡන්ද බලය හිමි වුයේ වයස අවුරුදු 21 ඉක්ම වූ පිරිමින්ට පමණි. 1910 අංක 13 දරන ආඥා පනතේ 9 වන වගන්තියේ සෑම මැතිවරණ කොට්ඨාසයකට ම පොදු වූ ඡන්ද බලය අහිමිවීමට බලපෑ කරුණු ඇතුළත් විය. අදාළ ආඥා පනතේ 15 වන වගන්තියේ, ලාංකික මැතිවරණ කොට්ඨාසයේ ඡන්දහිමියන් වීමට බලපැවැත් වූ, සෙසු මැතිවරණ කොට්ඨාසවලට අදාළ නොවූ විශේෂ සුදුසුකම් පනවා තිබීම කැපී පෙනෙන කරුණක් විය. එම සුදුසුකම් සියල්ලම නිරීක්ෂණය කිරීමේ දී පැහැදිලි වන්නේ, එකල ඉංග්‍රීසි භාෂාවේ පරිචයක් සහිතව රැකියාවල යෙදුණු වෘත්තිකයන් පිරිසකට පමණක් ලාංකේය මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද බලය හිමිවූ බවයි.

1920 නීතිය අනුව පිහිටුවන ලද මැතිවරණ කොට්ඨාස 16න් 07ක්, පළාත් 7කට සමාන විය. (මධ්‍යම, උතුරු, දකුණු, වයඹ, උතුරු මැද, ඌව හා සබරගමුව) ඉතිරි කොට්ඨාස 3ක් බස්නාහිර පළාතේ කොටස් 3කින් සමන්විත විය. වර්ෂ 1911 දී පැවති, යුරෝපීය නගර, ග්‍රාමීය හා බර්ගර් යන කොට්ඨාස තවදුරටත් පැවතිණි. 1911 දී නොතිබූ නව කොට්ඨාස 2ක් මෙවර ඇති විය. ඒ වාණිජ හා පහතරට වැවිලි යන කොට්ඨාසයන් ය. ඒවා පිළිවෙලින් ලංකා වාණිජ මණ්ඩලයේ සාමාජිකයින්ට හා පහතරට වැවිලි සමාගම් සාමාජිකයින්ට සීමා වූ, භූමිභාගයක පැතිරුණු ඒවා නොවූ මැතිවරණ කොට්ඨාසයන් ය.

1923 නීතිය අනුව ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්ගෙන් 29දෙනෙකු මැතිවරණ කොට්ඨාස 28ක් අනුව (එක් මැතිවරණ කොට්ඨාසයක් බහු මැතිවරණ කොට්ඨාසයක් විය.) ඡන්දයෙන් තෝරාගත යුතු විය. මින් පෙර තිබූ යුරෝපා නාගරික, ග්‍රාමීය, වාණිජ හා බර්ගර් යන කොට්ඨාස තවදුරටත් පැවතිණි. දිවයිනේ පළාත් හා ආදායම් කොට්ඨාස අනුව සෙසු ඒවා බෙදා තිබුණි. එසේම ලියාපදිංචිය වීම සඳහා පුද්ගලයෙකු වසරක කාලයක් මැතිවරණ කොට්ඨාසයේ පදිංචිව සිටීම ද අවශ්‍යතාවක් විය. මාස 12ක සිරදඬුවමක් ලැබූවෙකුට ද ඡන්ද බලය අහිමි විය.

1930 රාජ්‍ය මන්ත්‍රණ සභාවට මන්ත්‍රීවරු, කොට්ඨාස 50කින් තෝරාගත යුතු වූ අතර, ඒවායේ ලියාපදිංචිය සඳහා පනවා තිබූ සුදුසුකම් සමාන විය. මෙම සුදුසුකම්වල සමානත්වය ඉන්පසු පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය තුළ ද දැකිය හැකි විය. විශේෂයෙන් 1930 සිට සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම හේතුවෙන්, වයස අවුරුදු 21 ඉක්ම වූ පිරිමි හා ගැහැණු යන දෙපාර්ශවයටම ඡන්ද බලය හිමි විය.

පසු කලක දී, ඡන්දහිමියෙකු වීම සඳහා මැතිවරණ කොට්ඨාසයක පදිංචිව සිටිය යුතු කාලය පිළිබඳව වූ සුදුසුකමද වරින් වර වෙනස් වෙමින් නීතිය බල පැවැත්වුණු අතර, පසුව නිශ්චිත දිනයක (සුදුසුකම් ලැබීමේ දිනයේ දී) මැතිවරණ කොට්ඨාසයේ සාමාන්‍ය පදිංචිය සහිත අය සුදුසුකම ලැබීම දක්වා එම නීතිමය තත්ත්වය වෙනස් විය. මැතිවරණ කොට්ඨාසයක ලියාපදිංචිය සඳහා කිසියම් කාලයක් කොට්ඨාසය තුළ පදිංචිව සිටිය යුතුය යන්න නීතිගතව තිබුණේ 1910 දී පිහිටුවන ලද යුරෝපා මැතිවරණ කොට්ඨාස දෙක වෙනුවෙනි. ඒ අනුව, ඡන්දහිමි නාමලේඛනය ක්‍රියාත්මක වු වර්ෂයේ ජනවාරි 01වෙනි දිනට පූර්වයෙන්, එහි වසර 03ක් පදිංචිව සිටිය යුතු විය. 1920 නීතිය අනුව, සියලු මැතිවරණ කොට්ඨාසවලට අදාළ වන පරිදි, මැතිවරණ කොට්ඨාසයක පදිංචි වී සිටිය යුතු කාලය, ජූලි මස 31 දිනට පූර්වයෙන් වූ වසරක කාලයක් ලෙස නීතිගත විය. 1930 රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ක්‍රමය යටතේ එම කාලය මාස 06ක් බවට පත්විය.

පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය යටතේ ඡන්ද බලය හිමිවීමට බලපාන ලද සුදුසුකම් තවදුරටත් සංකීර්ණ විය. මෙම කාලය තුළ මැතිවරණ නීතිය අනුව මෙන් ම, අල්ලස් චෝදනා අනුව අධිකරණයේ දී වැරදිකරුවන් වන අයට වසර 03ක් හෝ 07ක් ආදී වශයෙන් ඡන්ද බලය අහිමි වන නීති සැකසිණි. විශේෂයෙන් 1948 ඇරඹුණු ශ්‍රී ලංකා පුරවැසිභාවය පිළිබඳ පනත් පැනවීම 2003 වර්ෂය දක්වා ම සිදුව ඇත. 1949.11.24 දිනැති, 1949 අංක 48 දරන මැතිවරණ සංශෝධන පනත අනුව ශ්‍රී ලාංකික පුරවැසියන්ට පමණක් ඡන්ද බලය හිමි විය. ලංකාවට නිදහස ලැබෙන විට මෙරටට වතු කෘෂිකාර්මික කටයුතු සඳහා ඉන්දියාවෙන් පැමිණ සිටි ද්‍රවිඩ වතු කම්කරුවන් පරම්පරා ගණනාවක් දිවයිනේ පදිංචිව සිටි නිසා ඔවුන්ට පුරවැසිභාවය ලබා දීම සම්බන්ධයෙන් ඉන්දියාව හා ලංකාව අතර සාකච්ඡා සිදු කොට අවස්ථා ගණනාවක දී ගිවිසුම් ඇති කර ගන්නා ලදී. කෙසේ වුව ද අවසානයේ දී මෙම දෙරටේම පුරවැසිභාවය නොලද පිරිසක් ලංකාවේ ජීවත්වන තත්ත්වයට පත්විය. මෙම තත්ත්වයන් නිසා ඡන්දහිමියන් ගණන් ගැනීමේ දී, විශේෂයෙන් වතු ප්‍රදේශවල ඡන්දහිමියන්ගේ සුදුසුකම් පරීක්ෂා කර සටහන් කර ගැනීමට හැකිවන පරිදි ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘති පත්‍ර නිර්මාණය කිරීමට මැතිවරණ බලධාරීන්ට සිදු විය.

## 05. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ නිලධාරී

යම් මහජන නියෝජිත ආයතනයකට ඡන්දයෙන් නියෝජිතයන් තේරීම සඳහා පදනම වන මැතිවරණ කොට්ඨාස අදාළ නීතියක් යටතේ පිහිටුවා අවසන් වූ සෑම අවස්ථාවක දීම අදාළ බලධාරියා විසින් ඒ ඒ මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් නිල නාමයකින් ලියාපදිංචි කිරීමේ නිලධාරියෙකු බැගින් පත්කොට ගැසට් පත්‍රයක් මාර්ගයෙන් ඒ පිළිබඳව ප්‍රසිද්ධ කෙරේ. එම කටයුතු සඳහා වර්ෂ 1911 සිට මේ දක්වා ම බොහෝ දුරට පත්කොට ඇත්තේ පළාත් ආණ්ඩු ඒජන්තවරු, පරිපාලන දිස්ත්‍රික්කවල දිසාපතිවරු හා සමහර අවස්ථාවල දී ආණ්ඩුවේ සහකාර ආණ්ඩුවේ ඒජන්තවරුන් ය.

1911 සිට 1923 දක්වා ව්‍යවස්ථාදායක සභා ඡන්ද විමසීම් ක්‍රමය යටතේ පිහිටුවා තිබූ බර්ගර් මැතිවරණ කොට්ඨාසයේ, වාණිජ කොට්ඨාසයේ හා පහතරට වතු නිෂ්පාදන සංගමයේ කොට්ඨාසයේ



ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වූයේ, පිළිවෙලින්, ආණ්ඩුකාරයා විසින් පත් කළ තැනැත්තෙකු, ලංකා වාණිජ මණ්ඩලයේ ලේකම් හා පහතරට වැවිලි සංගමයේ ලේකම් යන අයයි. තවද, 1930 වර්ෂයේ දී බස්නාහිර පළාතේ පිහිටුවන ලද මැතිවරණ කොට්ඨාස 03ක් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ද ලියාපදිංචි කිරීමේ නිලධාරයෙකු ලෙස පත්කර තිබුණි.

මැතිවරණ කොට්ඨාසය තුළ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන ඡන්දහිමියන් ගණන් ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙල යෙදීම හා ඉන් අනතුරුව මූලික ලේඛන මහජනයා වෙත ප්‍රර්ශනය කොට , අවශ්‍ය අයට හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීමට ඉඩ දිය යුතු ය. ඉදිරිපත් වී ඇති හිමිකම් හා විරෝධතා සම්බන්ධව පරීක්ෂණ පවත්වා තීරණ ගෙන, අදාළ තීරණ පාර්ශවකරුවන්ට දැන්වීම ද ලියාපදිංචි කිරීමේ නිලධාරියාගේ වගකීමක් වේ.

## 06. ඡන්දහිමියන් ගණන් ගැනීම

මැතිවරණ කොට්ඨාසයක ඡන්දහිමියන් ගණන් ගැනීම, අදාළ නීතිය යටතේ නියමිත කාලයක දී අරඹා අවසන් කිරීම, ලියාපදිංචි කිරීමේ නිලධාරියෙකුගේ වගකීමක් වන අතර, වර්ෂ 1911 සිට මේ දක්වා පැවති ඡන්දහිමියන් ගණන් ගැනීමේ ක්‍රමය වරින් වර වෙනස්කම්වලට බඳුන් වී ඇති බව, අදාළ නීති පරීක්ෂා කර බැලීමෙන් පැහැදිලි වේ.

### අ. ව්‍යවස්ථාදායක සභා ක්‍රමය යටතේ ඡන්දහිමියන් ගණන් ගැනීම (1910)

i. මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී විසින් ඡන්දහිමියන් ලෙස ලියාපදංචි වීමට සුදුසුකම් ඇති අයට ඒ සඳහා මාස 03ක කාලයක්, අයදුම්පත් ඉදිරිපත් කිරීමට කල් ලබා දෙමින්, ඒ පිළිබඳව ගැසට් පත්‍රයේ දැන්වීමක් පළ කරන ලදී.

ii. 1910 අංක 13 දරන ආඥා පනතේ “අ” උපලේඛනය අනුව වූ අයදුම්පතේ, මැතිවරණ කොට්ඨාසයේ නම, අයදුම්කරුගේ නම, ලිපිනය, රැකියාව, අවසන් උපන් දිනයට වයස හා අයදුම්කරුට මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි වීම සඳහා ඇති සුදුසුකම් එහි සඳහන් කළ යුතු විය.

iii. ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබුණු අයදුම්පත්වල සඳහන් තොරතුරු මත සෑහීමකට පත්වී අදාළ නම් ලියාපදිංචි කිරීම සිදු කර ඇති අතර, අයදුම්පතට අදාළ කරුණු සම්බන්ධව වෙනත් ආකාරයක කරුණු සොයා බැලීමක් සිදු කර ඇති බවක් නිරීක්ෂණය නොවේ.

iv. අයදුම්පත් අනුව සකසන ලද මූලික ලේඛනය මැතිවරණ කොට්ඨාසය තුළ පිහිටි කච්චේරියේ හා තවත් ස්ථානවල දිනකට සාධාරණ පැය ගාණක් බැගින් ප්‍රදර්ශනය කොට ඇත. මෙම ප්‍රදර්ශන සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ හා ඉංග්‍රීසි පුවත්පත්වල දැන්වීම් පළ කොට ප්‍රසිද්ධියක් ලබා දී ඇත. මෙම ප්‍රදර්ශන කාලය සති 04ක් වූ අතර, එම කාලයේ දී අවශ්‍ය අයෙකුට ලියාපදිංචි කිරීමේ නිලධාරියා වෙත හිමිකම් හෝ විරෝධතා ලිඛිතව දැන්වීමට ඉඩ ලබා දී තිබුණි.

v. දින 10ක කාලයක් ඇතිව අදාළ පාර්ශවයන්ට හිමිකම්/ විරෝධතා පරීක්ෂණ පිළිබඳව දන්වා, එම පරීක්ෂණ උසාවියේ දී හෝ තම කාර්යාලයේ දී පැවැත්වීමට ලියාපදිංචි කිරීමේ නිලධාරියා කටයුතු කොට ඇත. මේවායේ තීරණ ලැබී දින 10ක් තුළ, තීරණ සම්බන්ධව අභියාචනා ප්‍රතිශෝධන නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමට ද නීතිමය අවකාශ සලසා තිබුණි. ප්‍රතිශෝධන නිලධාරියා, ආණ්ඩුකාරයා විසින් පත්කරන ලද අධිකරණමය කටයුතු සම්බන්ධ දැනුමක් ඇති අයෙක් විය.

vi. හිමිකම්/ විරෝධතා පරීක්ෂණ ප්‍රතිඵල ද, අභියාචනා පරීක්ෂණ ප්‍රතිඵල ද සැලකිල්ලට ගෙන සකස් කරන ලද නාමලේඛනය අවසානයේ දී සහතික කරන ලදී.

ව්‍යවස්ථාදායක සභා ක්‍රමය යටතේ වූ මෙම නීති 1920 හා 1923 දී සුළු වශයෙන් වෙනස් වී ඇත. 1920 නීතිය අනුව ඡන්දහිමියන්ට තේරීම්භාර නිලධාරී වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමට තිබූ කාලය මාසයක් දක්වා අඩු කර තිබුණි.

### ආ. රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමය යටතේ ඡන්දහිමියන් ගණන් ගැනීම (1930)

ඩොනමෝර් කොමිෂන් සභා යෝජනා අනුව වයස අවු.21 ඉක්ම වූ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමය යටතේ ඡන්ද බලය ලැබීමත්, එවකට පළාත්වල ජන සංඛ්‍යාව පදනම් කොට ගෙන මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභාවක් විසින් දිවයින මැතිවරණ කොට්ඨාස 50කට බෙදීමත්, සියලු මැතිවරණ කොට්ඨාස වෙනුවෙන් ශ්‍රී ලාංකිකයනට සමාන සුදුසුකම් යටතේ ඒවායේ ඡන්ද බලය හිමිවීමත් යන කරුණු මෙකල “ඡන්ද බලය” සම්බන්ධ විශේෂිත අවස්ථා ලෙස දැක්විය හැකිය. ඊට අමතරව ව්‍යවස්ථාදායක සභා ක්‍රමය යටතේ ඡන්ද බලය හිමිව තිබූ යුරෝපියන්ට හා ඉන්දියානු වතු දෙමළ ජාතිකයන්ට රාජ්‍ය මන්ත්‍රණ සභා ක්‍රමය යටතේ යම් යම් ව්‍යතිරේකයන්ට යටත්ව ඡන්ද බලය ලැබීම ද වැදගත් කරුණක් ලෙස දැක්විය හැකිය.

1931 (රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ) රාජ මණ්ඩල ආඥාවේ, 6වන වගන්තියේ දැක්වුණු නුසුදුසුකම් එකකට හෝ යටත් පුද්ගලයෙකුට කිසිදු මැතිවරණ කොට්ඨාසයක ඡන්ද බලය හිමි නොවිය. එම නුසුදුසුකම් වන්නේ බ්‍රිතාන්‍ය යටත් වැසියකු නොවීම, අගෝස්තු මස 01 වන දිනට වයස අවුරුදු 21ක් සම්පූර්ණ නොවීම, එදිනට මැතිවරණ කොට්ඨාසයේ අවසන් මාස 18න් මාස 06ක් හෝ නොකඩවා පදිංචිව නොසිටීම, මරණ දඬුවමක් හෝ මාස 12කට වැඩි සිරදඬුවමක් ලැබීම, උසාවියකින් සිහිවිකල් වූවකු ලෙස තීන්දු කළ අයෙකු වීම හා 1931 නීතිය අනුව මැතිවරණ දූෂණයකට හෝ නීති විරෝධී ක්‍රියාවකට වරදකරුවෙකු වීම යනාදියි.

අදාළ ආඥා පනතේ පළමු වන උපලේඛනයේ “ආ” අක්ෂරය දරන ආකෘතිය අනුව සුදුසුකම් ලබන අය ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියාට නියමිත කාලයක් තුළ සිය අයදුම්පත ඉදිරිපත් කළ යුතු විය. එසේ ඉදිරිපත් කළ තොරතුරු සම්බන්ධයෙන් සෑහීමට පත් වී එම නිලධාරියා විසින් අදාළ ලියාපදිංචි කිරීම සිදු කරන ලදී. සෑම වසරකම අගෝස්තු 01 වන දිනට ඇති සුදුසුකම් අනුව අදාළ පුද්ගලයින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වූ අතර, ඒවා සැප්තැම්බර් මස 15 වන දිනට පෙර ලියාපදිංචි කිරීමේ නිලධාරියාට ලැබිය යුතු විය. හිමිකම් හා විරෝධතා පිළිබඳ පරීක්ෂණ පවත්වා ඒවායේ ප්‍රතිඵල ද සැලකිල්ලට ගෙන අවසන් නාමලේඛනය සහතික කරන ලදී.

1936 රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණය වෙනුවෙන්, 1935 ඡන්දහිමි නාමලේඛනය ඉහත දැක්වූ ක්‍රමයට වඩා වෙනස්









ආකාරයකට ප්‍රතිශෝධනය කරන ලදී. 1931 නීතිය අනුව උපත ශ්‍රී ලංකාවේ සිදු වීමෙන් අනතුරුව මෙහි පදිංචිව සිටින ලාංකික පිරිස හා වසර 05කට අධික කාලයක් ලංකාවේ පදිංචිව සිටි, ඉන්දීය වතු කම්කරුවන්ට ද, ඔවුන් 1935 වන විට නාමලේඛන ගතව සිටියේ නම්, ඒ ආකාරයටම 1935 ඡන්දහිමි නාමලේඛනයට, අයදුම්පත් ලබා ගැනීමකින් තොරව ඔවුන්ගේ නම් නාමලේඛන ගත කරන ලදී. ගම්මුලාදෑනීන්, වතු අධිකාරීන් හා තාවකාලික ගණන් ගන්නා නිලධාරීන් වෙතින් අදාළ අයගේ තොරුතුරු සොයා බැලීමට කටයුතු කරන ලදී. මේ සඳහා කොළඹ මහනගර සභා ප්‍රදේශයේ ගණන් ගන්නා නිලධාරීන් ලෙස, එම මහනගර සභාවේ පරීක්ෂකවරුන්, ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බැහැරව යොදා ගෙන ඇත.

**ඇ. 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ ආඥාව යටතේ ඡන්දහිමියන් ගණන් ගැනීම**

මෙම රාජ්‍ය ආඥාවේ 04 වන වගන්තියේ, ඡන්දහිමියෙකු වීම සඳහා පුද්ගලයෙකු විසින් සම්පූර්ණ කළ යුතු සුදුසුකම් පිළිබඳව සඳහන් විය. පසු කලෙක මෙම සුදුසුකම්ද සංශෝධනයට ලක්විය.

එහෙත් 1946 අගෝස්තු මස 29 වන දින අත්සන් කරන ලද මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කොමිෂන් සභා වාර්තාව අනුව පිහිටුවන ලද මැතිවරණ කොට්ඨාස 89ට අදාළ ප්‍රථම ඡන්දහිමි නාමලේඛනය සැකසීම සම්බන්ධයෙන් වූ නීතිමය විධි විධාන, 1946 මැයි 15 වන දිනැති 1946 ලංකා (මැතිවරණ නාමලේඛන) (විශේෂ විධි විධාන) පනතට ඇතුළත් විය. ඒ අනුව 1931 ලංකා (රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ) රාජ්‍ය මන්ත්‍රණ සභා ආඥාව අනුව සකස් කොට අවසන් වරට සහතික කළ, මැතිවරණ කොට්ඨාස 50ට අදාළ නාමලේඛනයට ඇතුළත්ව තිබූ නම්, නව මැතිවරණ කොට්ඨාස 89හි සීමා අනුව ඒවාට ඇතුළත් කොට, නව මැතිවරණ කොට්ඨාසවල නාමලේඛන 1946 සැප්තැම්බර් 26 වන දින මහජනයා සඳහා ප්‍රදර්ශනයට තබන ලදී. එම නාමලේඛනයට අලුතින් නම් ඇතුළත් කිරීමට හා ඉන් ඉවත් කළ යුතු නම් ඉවත් කිරීමට අදාළ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීමට අවකාශ ලබා දෙන ලද්දේ, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ ආඥාවේ ප්‍රතිපාදනයන් අනුව ය.

නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා සෑම වසරකම ජූලි මස 01 වන දින හෝ එදිනට ප්‍රථමයෙන්, ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල දැන්වීම් පළ කොට සුදුසුකම් ඇති අයට අදාළ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට දැනුම් දෙන ලදී. මෙසේ පුද්ගලයින්ගේ තොරතුරු ලබා ගැනීමට අදාළ මැතිවරණ රාජ ආඥාවේ 16 (3) වගන්තිය යටතේ, පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්වරයාට තිබූ බලතල අනුව ඒ සඳහා වන ආකෘති පත්‍රයක් 1948 ජූලි 04 වන දින අංක 9873 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබී ය. එම ආකෘතියේ පළවන කොටසින් ලියාපදිංචි කිරීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු විස්තර පහත සඳහන් පරිදි, තීරු කිහිපයක් යටතේ ගෘහ මූලිකයා විසින් පවුලේ අදාළ සුදුසුකම් ලබන සියලුදෙනා වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු විය. මෙය ගෘහ මූලිකයෙකුට නිශ්චිත ආකෘතියක් මගින් පවුලේ අදාළ සියලුදෙනා වෙනුවෙන් ලියාපදිංචි කිරීමේ නිලධාරීට තොරුතුරු ඉදිරිපත් කිරීමට නියම වූ ප්‍රථම අවස්ථාව ලෙස හැඳින්විය හැකි ය. එම ආකෘතියේ අදාළ තීරු යටතේ පහත සඳහන් විස්තර ඇතුළත් කළ යුතු විය.

(1) ජූනි 01 වන දිනට වයස අවුරුදු 21 ඉක්ම වූ අයගේ සම්පූර්ණ නම
(2) ස්ත්‍රී පුරුෂ භාවය
(3) ජූනි 01 වන දිනට පූර්වයෙන් වූ මාස 18ක කාලයෙන් මාස 06ක් නොකඩවා පදිංචිව සිටි ලිපිනය
(4) ප්‍රථමයෙන් ලියාපදිංචිව සිටි ලිපිනය
(5) ඉන්දියානු හා පාකිස්ථානු සම්භවයක් සහිත පුද්ගලයන්ට අදාළ කරුණු (ලංකාවේ වාසය කළ කාලය, ලංකාවේ ඉපදුන අයෙකු ද යන වග, විවාහක ද යන වග, භාර්යාව/ ස්වාමිපුරුෂයා ලංකාවේ පදිංචිව සිටී නම් එම අය පසුගිය වසර 10තුළ ඉන්දියාවට/ පාකිස්ථානයට ගමන් කළ වාර ගණන හා එසේ ගමන් කිරීමට හේතු)

මෙම ආකෘතිය සම්පූර්ණ කොට නියමිත දිනට පෙර ලියාපදිංචි කිරීමේ නිලධාරියා වෙත යැවිය යුතු විය. එම ආකෘතියේ දෙවන කොටස අදාළ වූයේ, ගෘහ මූලික විසින් ලියාපදිංචි කිරීමේ නිලධාරියාට ඉදිරිපත් කරනු ලබන තොරතුරුවල යම් අඩුපාඩුවක් ඇත්නම් ඒ සඳහා විමසීමක් කොට අවශ්‍ය තොරතුරු එම නිලධාරියාට ලබා ගැනීම සඳහා ය.

ගෘහ මූලිකයින්ගෙන් අදාළ තොරතුරු ලබා ගැනීමෙන් පසු නාමලේඛනය සැකසීම සම්බන්ධයෙන් පහත පියවර ගන්නා ලදී.

01. ප්‍රවර්ථන නාමලේඛනය සමග සසඳා බලා ඉන් ඉවත් කිරීමට සිදුවන නම් හා නාමලේඛනයට අළුතින් ඇතුළත් වන නම් ලේඛන ගත කර කච්චේරිවල හා වෙනත් සුදුසු ස්ථානවල මහජනයා වෙනුවෙන් ප්‍රදර්ශනය කිරීම. (පසු කලෙක මෙම ප්‍රකාශන කාලය සති 4ක් බවට පත්ව ඇත.)

02. ප්‍රදර්ශන කාලයේ දී ඉදිරිපත් වන හිමිකම් හා විරෝධතා අනුව පරීක්ෂණ පවත්වා අවසානයේ දී සුදුසුකම් ලබන නම් ඇතුළත් කරමින් නාමලේඛනය සකස් කොට සහතික කරන ලදී. ඒ පිළිබඳව පුවත්පත්වල හා ගැසට් පත්‍රයේ දැන්වීම් ද පළ කරනු ලැබිණි.

## 07. වර්ෂ 1946ට පසු ඡන්දහිමියන් ගණන් ගැනීමට අදාළ නීතිය හා ක්‍රියාවලිය පිළිබඳව සිදු වූ වැදගත් වෙනස්කම්

**(01.) ශ්‍රී ලංකා පුරවැසිභාවය ලද අයට ලංකාවේ ඡන්ද බලය සීමා කිරීම (1949)**

1948 වර්ෂයට පෙර බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වූ ලංකාවේ වැසියන් එම කාලයේ දී, බ්‍රිතාන්‍ය යටත් වැසියන් ලෙස හඳුන්වන ලදී. අදාළ මැතිවරණ නීතිවල ඔවුන් හඳුන්වන ලද්දේ ද ඒ ආකාරයටම ය. 1948.02.04 වන දින ශ්‍රී ලංකාව නිදහස් රාජ්‍යයක් බවට පත්වීමෙන් පසු ශ්‍රී ලංකා පුරවැසිභාවයට අදාළ නීති සම්පාදනය වූ අතර, එම නීති මගින් ලාංකික පුරවැසිභාවය හිමි වීම, ඡන්ද බලය ලැබීම සඳහා ප්‍රධාන අවශ්‍යතාවක් විය. ලංකාවේ ප්‍රථම පුරවැසි පනත වූ 1948 අංක 18 දරන පනතට පසුව ඒ හා සම්බන්ධ තවත් නීති සම්පාදනය විය.

1949 අංක 48 දරන පාර්ලිමේන්තු මැතිවරණ සංශෝධන පනතින්, ඡන්ද බලය හිමිවන තැනැත්තන් ලංකා පුරවැසියන් විය යුතු බවට නියම විය.

**(02.) බහු ලියාපදිංචිය නිත්‍යානුකූල නොවන බැවින් පුද්ගලයින් ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි කිරීම එක් ලිපිනයකට සීමා කිරීම. (1949 අංක 48 දරන සංශෝධන පනත)**






මීට අදාළ නව වගන්තියක්, 16 (7) උප වගන්තිය වශයෙන්, ප්‍රධාන ප්‍රඥප්තිය වූ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ ආඥාවට ඇතුළත් කරන ලදී. ඒ අනුව එක් ලිපිනයකට වැඩි ලිපිනයන් සංඛ්‍යාවක් යටතේ නමක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත්ව ඇත්නම් හෝ ලේඛන ගතව ඇත්නම්, අදාළ පුද්ගලයාගේ නම ඇතුළත් කළ යුතු වූ එක් ලිපිනයක් පිළිබඳව එම අයගෙන් කැමැත්ත විමසා ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට ලියාපදිංචි කිරීමේ නිලධාරියාට බලයක් ලැබිණි.

**(03.) වාර්ෂික ඡන්දහිමි නාමලේඛනය කටයුතු අවසන් කිරීම සඳහා කාලවකවානු නියම කිරීම (1950 අංක 38 දරන සංශෝධන පනත)**

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 (2) වගන්තිය අනුව, ප්‍රතිශෝධනය කරනු ලබන නාමලේඛනයේ කටයුතු අගෝස්තු 15 දිනට පෙර අවසන් කිරීමට හෝ එසේ නොමැති නම් මැතිවරණ කොමසාරිස්වරයා ගැසට් නිවේදනයක් මගින් නියම කරනු ලබන දිනයක් ඒ සඳහා නියම කළ හැකි විය. එහෙත් මෙම සංශෝධන පනත අනුව, එම නාමලේඛන කටයුතු අගෝස්තු මස 15 වන දින වන විට අවසන් නොවන්නේ නම්,ඒ සඳහා ඊළඟ වසරේ ජනවාරි මස 31 දිනයට පසු නොවන දිනයක් කොමසාරිස්වරයා විසින් නියම කළ යුතු විය.

**(04.) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා ඡන්දහිමි නාමලේඛන සැකසීම (1951 පාලන වාර්තාව අනුව)**

ගම්සභා බලප්‍රදේශවලට අදාළව ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනය කිරීම, සැප්තැම්බර් 01 වන දින වසර 03කට වරක් ඇරඹී ඇත. මහනගර සභා, නගර සභා සහ සුළු නගර සභා බල ප්‍රදේශවල ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය, එම දිනයේ දී ම අරඹා වාර්ෂිකව සිදු කර ඇත. කොළඹ හා මහනුවර මහනගර සභා ප්‍රදේශවල ඡන්දහිමියන් ගණන් ගැනීම මැතිවරණ කාර්යාලවලින් යොදා ගන්නා නිලධාරීන් මාර්ගයෙන් ද සෙසු ප්‍රදේශවල එම කටයුතු ගම්මුලාදෑනීන් මාර්ගයෙන් ද සිදු කරවා ගෙන ඇත. ඒ සඳහා ඔවුන්ට ගෙවීම් ද කර ඇත.

1953 අංක 25 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සංශෝධන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 15 (3) වගන්තිය අනුව, පාර්ලිමේන්තු මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළාත් පාලන ආයතන කටයුතු පිළිබඳ කොමසාරිස්වරයාට, පාර්ලිමේන්තු මැතිවරණ ඡන්දහිමි නාමලේඛනයේ අදාළ විස්තර පළාත් පාලන ඡන්ද විමසීම් සඳහා නාමලේඛන සැකසීමට ලබාදිය යුතු විය. මේ අනුව මෙම අවස්ථාව වන විට, පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අවශ්‍ය ඡන්දහිමි නාමලේඛනය සැකසීමට පදනම් වී ඇත්තේ පාර්ලිමේන්තු ඡන්දහිමි නාමලේඛනයයි.

ඉහත තත්ත්වය නිසා යම් පළාත් පාලන ආයතන සංඛ්‍යාවකට යම් වර්ෂයක දී පළාත් පාලන මහ මැතිවරණයක් පැවැත්වීමට නියමව තිබේ නම්, අදාළ ඡන්දදායකයින් එම වර්ෂයේ පාර්ලිමේන්තු ඡන්දහිමි නාමලේඛනයට සිය නම් ලියාපදිංචි කරවා ගැනීමට උනන්දු විය යුතු බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පළාත් පාලන ආයතනවලට දැනුම් දීම පුරුද්දක් කර ගෙන සිට ඇත. දැනට පාර්ලිමේන්තු මැතිවරණ ඡන්දහිමි නාම ලේඛනය පමණක් සකසා එය පළාත් පාලන ඡන්ද විමසීම් සඳහා ද භාවිතා කෙරේ.

**(05.) බහුතර ජනතාවගේ සහ සුළුතර ජනතාවගේ භාෂාවෙන් ඡන්දහිමි නාමලේඛනය සැකසීම (1956 අංක 16 දරන සංශෝධන පනත)**

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය අනුව, ඡන්දහිමි නාමලේඛනය ඉංග්‍රීසි භාෂාවෙන් සැකසිය යුතු විය. ඡන්දහිමි නාමලේඛනයක් සම්පූර්ණයෙන් මුද්‍රණය කරන ලද්දේ, මැතිවරණ කොට්ඨාසයක අතුරු මැතිවරණයක් හෝ පාර්ලිමේන්තු මහ මැතිවරණයක් පැවැත්වීමට නියමිතව ඇති විටක දී මැතිවරණ කොමසාරිස්වරයාගේ නියමය පරිදි රජයේ මුද්‍රණාලය විසිනි. නාමලේඛ ප්‍රතිශෝධන අවස්ථාවල දී ප්‍රදර්ශනය කරන ලද්දේ සහතික කර ඇති අවසන් නාමලේඛනය සමග ප්‍රතිශෝධනයට අදාළව වාර්ෂිකව පිළියෙල කළ "අ" සහ "ආ" නාමලේඛන පමණි.

1956 අංක 16 දරන සංශෝධන පනතින් මැතිවරණ කොට්ඨාසයක නාමලේඛනය එම කොට්ඨාසයේ බහුතර ජනතාවගේ භාෂාවෙන් සැකසීමට නියම විය. තවද, එබඳු කොට්ඨාසයක ජන සංඛ්‍යාවෙන් 20%කට වැඩි ජන සංඛ්‍යාවක් සුළු ජාතික කොට්ඨාසයක් වේ නම් ඔවුන්ගේ භාෂාවෙන් ද එම නාමලේඛනය සැකසිය යුතු වේ.

**(06.) මැතිවරණ කොට්ඨාසය තුළ පදිංචිය හා සාමාන්‍ය පදිංචිය**

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 ඇ වගන්තිය අනුව, වර්ෂයක ජූනි මස 01 වන දිනයට පෙරාතුව වූ මාස 18ක නොකඩවා මාස 06ක් මැතිවරණ කොට්ඨාසයක පදිංචිව සිටීම, ඡන්දහිමියෙකු වශයෙන් අදාළ මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචිය සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතාවක් විය. 1964 අංක 10 දරන සංශෝධන පනතින්, මෙම වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට ඇතුළත් කළ නව වගන්තිය අනුව, වර්ෂයක ජූනි මස 01 වන දින, යම් අයෙකුගේ මැතිවරණ කොට්ඨාසය තුළ සාමාන්‍ය පදිංචිය, ලියාපදිංචිය සඳහා ප්‍රමාණවත් ය.

විශේෂයෙන් 1970 දශකයේ සිට විශාල වශයෙන් රැකියා සහ අධ්‍යාපන කටයුතු සඳහා විදෙස් ගත වූ ශ්‍රී ලාංකිකයින්ගේ ඡන්ද බලයට අදාළව මෙම සාමාන්‍ය පදිංචිය සම්බන්ධ නීතිමය තත්ත්වය මැතිවරණ කොමසාරිස්වරයා විසින් නීතිපතිවරයාගෙන් ද විමසන ලදී. ඒ අනුව 1981 ඔක්තෝම්බර් මස 02 වන දින නීතිපතිවරයා විසින් සිය මතය දක්වමින් දන්වා ඇත්තේ, යම් තැනැත්තෙකු රැකියාවක් හෝ අධ්‍යාපන කටයුත්තක් හේතුවෙන් තාවකාලිකව රටින් බැහැරව සිටී නම්, ඔහුට මෙරටට පැමිණීමට හිමිකම ඇති ස්ථානය, ඔහුගේ සාමාන්‍ය පදිංචි ලිපිනය සේ සලකා කටයුතු කළ හැකි බව ය. විශේෂයෙන් එසේ විය යුත්තේ එම අයගේ පවුලේ සෙසු සාමාජිකයන් එබඳු ස්ථානයක පදිංචිව සිටී නම් ය. ඒ අනුව මේ ආකාරයට විදෙස් ගතව අධ්‍යාපනය හා රැකියා කටයුතු සඳහා සිටින අය, ඔවුන්ගේ සාමාන්‍ය ලිපිනය යටතේ ලියාපදිංචි සඳහා නිර්දේශ කළ හැකි බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් මාර්ගයෙන් ගණන් ගැනීමේ නිලධාරීන්ට, 1981 නාමලේඛන ප්‍රතිශෝධන අවස්ථාවේ දී දැනුම් දී ඇත.

**(07.) වසර 03කට වරක් "අ" ලැයිස්තු ගතවන නම්වලට අදාළ පුද්ගලයින්ට නාමලේඛනයේ නම් ඉවත් කිරීම පිළිබඳව හේතු සහිතව දැනුම් දීම**

1959 අංක 11 දරන සංශෝධන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියට 18 (3) වන උප වගන්තියෙන් හඳුන්වා දෙන ලදී. ඒ අනුව නාමලේඛනයක් සහතික කිරීමෙන් සෑම වසර 03කට ම පසු, "අ" ලැයිස්තු ගත වූ නම්වලට අදාළ පුද්ගලයන්ට, එසේ නම් ඉවත් වීමට හේතු ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් දැනුම් දිය යුතු විය.



මේ අනුව 1961 වසරේ හා 1962 වසරේ නාමලේඛනවල ලියාපදිංචි නිවාස, පිළිවෙලින් 1,392,667කට සහ 1,481,848කට උඩෟතයන් යවා ලියාපදිංචි වීමේ අඩුපාඩු ඇත්නම් සංශෝධනය විය යුතු ආකරය ගෘහ මුලිකයින්ගෙන් විමසා ඇත. ඒ සඳහා වූ ගෘහ මුලිකයින්ගේ ප්‍රතිචාරයන් අදාළ වර්ෂ 02දී පිළිවෙලින් 15%ක් හා 07%ක් පමණ වූ බව, මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්ෂික වාර්තාවල දැක්වේ. මෙම නීතිමය ප්‍රතිපාදනයන් 1964 අංක 10 දරන සංශෝධන පනතේ 10 වන වගන්තිය මගින් අවලංගු කරනු ලැබීය.

**(08.) ඡන්ද බලය ලැබීමට සුදුසු වයස අඩු කිරීම**

ප්‍රධාන ප්‍රඥප්තියේ 4(1) (ආ) ඡේදය අනුව, පුද්ගලයෙකු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට, අදාළ වර්ෂයේ ජුනි 01 වන දිනට වයස අවුරුදු 21ක් සම්පූර්ණ විය යුතු විය. 1959 අංක 11 දරන සංශෝධන පනතේ 02 වන වගන්තිය මගින්, මෙම වයස් ප්‍රමාණය, අවුරුදු 18 දක්වා අඩු කරන ලදී.

**(09.) ඡන්දහිමියන්ගේ විස්තර ගෘහ මුලිකයන් ලවා ආකෘතියක් මගින් සම්පූර්ණ කරවා ගැනීම. (1957 පාලන වාර්තාව)**

ගණන් ගන්නා නිලධාරියෙකු විසින් නිවෙස්වල පදිංචි ඡන්දහිමියන් ගණන් ගැනීම වෙනුවට, පළමුවරට දිවයිනේ සෑම ප්‍රදේශයකම නිවෙස්වල ගෘහ මුලිකයින් වෙත, ගෘහයේ පදිංචි ඡන්දහිමියන්ගේ විස්තර ලබා ගැනීමට උපදෙස් ද සමග ආකෘති පත්‍රයක් භාරදීමේ වැඩපිළිවෙලක් 1957 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන අවස්ථාවේ දී අරඹා ඇත.

**(10.) වාර්ෂික ප්‍රතිශෝධනයට අදාළ "අ" සහ "ආ" ලැයිස්තු එකම කාල පරිච්ඡේදයක දී ප්‍රදර්ශනය කිරීම (1957 පාලන වාර්තාව)**

දිවයිනේ පිහිටි සෑම මැතිවරණ කොට්ඨාසයකටම අදාළව, ප්‍රථම වරට ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන අවස්ථාවේ දී "අ" (ප්‍රවර්තන නාමලේඛනයෙන් ඉවත් කිරීමට යෝජිත නම් ඇතුළත්) නාමලේඛනය හා "ආ" (ප්‍රතිශෝධිත නාමලේඛනයට අළුතින් ඇතුළත් කිරීමට යෝජිත නම් ඇතුළත්) නාමලේඛනය, එකම කාලපරිච්ඡේදය දී ප්‍රදර්ශනය කිරීම සිදු විය. එම කාලය 1957.12.27 සිට 1958.01.24 දින දක්වා විය.

**(11.) ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ නීතිය ඇතුළත් නව පනතක් එළි දැක්වීම**

ලංකාවේ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ කර්තව්‍ය වෙනුවෙන් ම නිශ්චිත වූ නීති මාලාවක් ඇතුළත් පනතක් ලෙස 1980 අංක 44 දරන පනත එළි දැක්වුණු අතර, එය 1981.01.23 වන දින සිට ක්‍රියාත්මක විය. මීට ප්‍රථමයෙන් ව්‍යවස්ථාදායක සභා ක්‍රමය හා 1946 පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය යටතේ මෙම නීති ඇතුළත් වුයේ වෙනත් නීති සංග්‍රහයක කොටස් වශයෙනි. මීට පෙර රාජ මන්ත්‍රණ සභා නීතිය යටතේ නාමලේඛන සකස් කිරීම පිළිබඳව වෙන් වූ රාජ මණ්ඩල ආඥාවක් පනවා තිබුණ ද එය මෙතරම් සවිස්තරාත්මක එකක් නොවූ වගන්ති 19ක් පමණක් ඇතුළත් වූවක් විය. (The Ceylon Constitution (Register of Electors) Ordinance Council 1930).

**(12.) ඡන්දහිමියන්ගේ ජාතික හැඳුනුම්පත් විස්තර ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් කිරීම**

1984 වර්ෂයේ සිට ගෘහ මුලිකයන් ලවා ඔවුන්ගේ නිවෙස්වල පදිංචි ඡන්දහිමියන්ගේ විස්තර ලබා ගැනීමට සපයන ලද ආකෘති පත්‍රය මගින්, අදාළ පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත් අංක ද ලබා ගැනීමට ක්‍රියා කර ඇත. එම වසරේ ලියාපදිංචි වූ ඡන්දහිමියන් සංඛ්‍යාව 64% පමණ සංඛ්‍යාවකගේ එම තොරතුරු නාමලේඛන ගත විය. මෙම වර්ෂයේ සිට නොකඩවා නාමලේඛන ප්‍රතිශෝධන අවස්ථාවේ දී මෙම විස්තර ලියාපදිංචි කිරීමේ නිලධාරි විසින් රැස් කළ ද, ඒ වන විට සිවිල් පරිපාලන කටයුතු අඩාලව පැවති උතුරු හා නැගෙනහිර පළාත්වල එම තොරතුරු ලබා ගැනීම අරඹන ලද්දේ ඉන් පසුව ය.

**(13.) වැවිලි වතු ප්‍රදේශවල ඡන්දහිමියන්ගේ වර්ධනය**

ලංකාවේ වතු කෘෂිකාර්මික කටයුතු සඳහා මෙරටට ඉන්දියාවෙන් පැමිණි කම්කරු පිරිසට, ලංකා පුරවැසිභාවය හෝ ඉන්දියානු පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ අභිලාෂයෙන් දෙරටේ රාජ්‍ය නායකයන් අතර ඇති වූ එකඟතාවන් මත පුරවැසිභාවය ප්‍රදානය කිරීම සිදු කළ ද, 1980 අග භාගය වන විට කිසිදු රටක පුරවැසිභාවයක් නොලැබූ පුද්ගලයින් සෑහෙන සංඛ්‍යාවක් මෙරට පදිංචි වී සිටියහ. මෙම ගැටළුව විසඳීම සඳහා 1988 අංක 39 දරන අදේශීකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත එළි දැක්විණි. මේ හේතුව නිසා විශේෂයෙන් අදාළ වතු අශ්‍රිත ප්‍රදේශවල ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි වන පිරිස ඉහළ ගියේය. පහත සඳහන් ඡන්ද ප්‍රදේශ 05ට අදාළ ඡන්දහිමියන් ලියාපදිංචිය පිළිබඳ 1986 සිට 1989 දක්වා වූ විස්තර මීට සාක්ෂි දරයි.

| ඡන්ද ප්‍රදේශයේ නම | ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව | |
|---|---|---|
| | 1986 | 1989 |
| නුවරඑළිය-මස්කෙළිය | 96,473 | 184,180 |
| පස්සර | 30,685 | 41,541 |
| හපුතලේ | 30,384 | 42,987 |
| කොත්මලේ | 38,331 | 49,905 |

**(14.) ඡන්දහිමියන් ගණන් ගැනීම නිරීක්ෂණය කිරීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂවලට අවකාශය ලබා දීම.**

1980 දශකයේ ආරම්භක අවධියේ සිට ඡන්දහිමියන් ගණන් ගන්නා නිලධාරින්ගේ ප්‍රතිශෝධන ලේඛන දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ට භාරදීමට ප්‍රථම, ගණන් ගන්නා නිලධාරීන් සකසා ඇති "අ" සහ "ආ" ලැයිස්තු ද, ගෘහ මුලිකයින් භාරදී ඇති ආකෘති පත්‍ර ද ග්‍රාම නිලධාරී කාර්යාලවල දී පරීක්ෂා කිරීමට, පිළිගත් දේශපාලන පක්ෂවලින් නම් කරනු ලබන පක්ෂ නියෝජිතයින්ට ඉඩ ලබාදීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. එබඳු අවස්ථාවක දී ඔවුන්ට නිරීක්ෂණය වන යම් කාරණාවක් ලියාපදිංචි කිරීමේ නිලධාරියාට ඉදිරිපත් කළ යුතු වන්නේ නම් ඒ සඳහා ද ඔවුන්ට ඉඩ ලැබුණි.

ඉන් අනතුරුව දේශපාලන පක්ෂ නායකයන්ගේ රැස්වීමක දී තීරණය කළ පරිදි, 1981 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී එක් එක් ඡන්ද කොට්ඨාසයක් සඳහා පිළිගත් දේශපාලන පක්ෂ විසින් පත්කරනු ලබන නියෝජිතයන්ට, ඡන්දහිමියන් ගණන් ගන්නා නිලධාරි සමග ගණන් ගැනීම නිරීක්ෂණය කිරීම සඳහා නිවාසවලට යාමට ඉඩදීමට තීරණය වී ඇත. මේ සඳහා ගණන් ගන්නා නිලධාරීන් විසින් තම ක්ෂේත්‍ර වැඩසටහන, දේශපාලන පක්ෂ විසින් නම් කරනු ලබන පක්ෂ නියෝජිතයින්ට දැනුම් දිය යුතු විය.

09 වන පිටුවට...





# පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම


සීමා නිර්ණය කොමිෂන් සභාවේ
සභාපති ආචාර්ය කේ.තවලිංගම්
සම්බන්ධීකරණ ලේකම් නලින් සේමගේ




**1.0. හැඳින්වීම**

පළාත් යනු ශ්‍රී ලංකාවේ පළමු පෙළේ පරිපාලන බෙදීමයි. මෙරට පළමුව පළාත් බෙදනු ලැබුයේ 1833 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය පාලකයන් විසිනි. ඉන් අනතුරු සියවසක පමණ කාලයක් තිස්සේ බොහෝ පරිපාලන කටයුතු දෙවැනි පෙළේ පරිපාලන බෙදීම වන දිස්ත්‍රික්කවලට පවරන ලදී. විසිවැනි සියවස මැද භාගය වන විට පළාත යන්න හුදෙක් චාරිත්‍ර විධිවලට සීමා වන්නට විය. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද දහතුන් වැනි සංශෝධනය අනුව පළාත් සභා බිහිවීමත් සමඟ මෙම තත්ත්වය වෙනස් විය. අද වන විට මේ රටේ පළාත් නවයක් පවතී.

**2.0. පරිපාලන ඒකකවල ඉතිහාසය**

අනුරාධපුර රාජධානි සමයේ දී ලංකාව මුලින්ම පරිපාලන ඒකක කිහිපයකට බෙදුණි. ඒ අනුව එකල රජරට, රුහුණුරට හා මායා රට යනුවෙන් ලංකාව පළාත් තුනකට බෙදී තිබුණි. කලින් කලට එක් රාජධානියකට වඩා වැඩි ගණනකට බෙදී යාම ද විදේශීය යටත් විජිත පාලකයන් මෙරටට පැමිණීම ද ඔවුන්ට රටේ කොටස් නතු වීම ද හේතු කොට ගෙන මෙම ව්‍යුහය වෙනස් වීම්වලට භාජනය වන්නට විය.

1505 පෘතුගීසීන් පැමිණ රටේ මුහුදුබඩ කොටස් අත්පත් කර ගෙන ඔවුන්ගේ පාලන කටයුතු කරන ලද්දේ ඒ වන විට මෙරට බෙදී තිබුණු පරිපාලන කොට්ඨාස ක්‍රමය අනුවම ය. ලන්දේසීහු තමන් අත්කරගත් ප්‍රදේශ, පරිපාලන කොට්ඨාස තුනකට බෙදූහ. එම කොට්ඨාස පෙර පැවති ක්‍රමය වූ දිසාව නමැති කොට්ඨාසවලට නැවත බෙදන ලදී. පසුව බ්‍රිතාන්‍යයෝ ද මෙම ක්‍රමයම අනුගමනය කළහ.

**3.0. ශ්‍රී ලංකාවේ සීමා නිර්ණය හා පළාත් පිහිටු වීම.**

1815 දී ලංකාව බ්‍රිතාන්‍යයන් සියතට ගත් පසු 1829 වර්ෂයේ දී පරිපාලන ව්‍යුහය ද ඇතුළුව යටත් විජිතය විමර්ශනය කරනු පිණිස කෝල්බෘක් - කැමරන් කොමිෂන් සභාව පත්කරන ලදී. එම කොමිෂන් සභාවේ නිර්දේශය වුයේ මුළු රටම භූගෝලීය වශයෙන් වූ පළාත් පහකට බෙදිය යුතු බව ය. ඒ අනුව 1833 ඔක්තෝම්බර් 01 වැනි දින එකම පරිපාලන ඒකකයක් යටතේ පළාත් පහක් බිහිවිය.

**4.0. පළාත් පරිපාලන ඒකක වර්ධනය වීම**

ඉන් අනතුරුව වූ වසර ගණන තුළ තවත් පළාත් 4ක් ඇති කිරීමත් සමඟ පළාත් සංඛ්‍යාව 9ක් දක්වා වර්ධනය විය. එනම්,

- බස්නාහිර පළාතේ උතුරු දිග්භාගය වෙන් කොට 1845 වර්ෂයේ දී වයඹ පළාත බිහි කරන ලදී.
- උතුරු පළාතේ දකුණු දිග කොටසක් හා නැගෙනහිර පළාතේ වයඹ කොටසක් එකතු කොට 1873 වර්ෂයේ දී උතුරු මැද පළාත බිහි කෙරිණ.
- මධ්‍යම පළාතේ, නැගෙනහිර පළාතේ සහ දකුණු පළාතේ කොටස් එකතු කොට 1886 වර්ෂයේ දී ඌව පළාත පිහිටුවන ලදී.
- 1889 වර්ෂයේ දී බස්නාහිර පළාතෙන් කොටස් වෙන් කොට ගෙන සබරගමුව පළාත බිහි කෙරිණි.

**5.0. පළාත් සභා පිහිටු වීම**

ශ්‍රී ලංකාවේ පැවති සිවිල් යුද්ධය නිම කිරීමේ ප්‍රයත්නයක් වශයෙන් 1987 ජූලි 29 දින ඉන්දු-ලංකා සම්මුතිය අත්සන් කරන ලදී. සම්මුතියේ එක් අපේක්ෂාවක් වුයේ ශ්‍රී ලංකා රජය පළාත්වලට බලය විමධ්‍යගත කළ යුතු බවයි. ඒ අනුව 1987 නොවැම්බර් 14 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දහතුන්වන සංශෝධනය ඇතුළත් කොට හා 1987 අංක 42 දරන පළාත් සභා පනත සම්මත කරන ලදී. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පළාත් නවයකි (09). 1987 ඉන්දු - ලංකා සම්මුතිය අනුව උතුරු හා නැගෙනහිර පළාත් දෙක එක් පළාතක් ලෙස ඒකාබද්ධ කරන ලදුව, 1988 වර්ෂයේ දී මුලින්ම පිහිටුවන ලද පළාත් සභා සංඛ්‍යාව අටක් (08) පමණක් විය. එහෙත් උතුරු - නැගෙනහිර පළාත 2007 ජනවාරි 01 වැනි දින නැවත එකිනෙකින් වෙන් කරන ලදී.

**6.0. පළාත් සභා ඡන්ද විමසීම්**

1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත අනුව "නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය" පිළිබඳ මූලධර්මය මත පිහිටා ඒ ඒ පළාත්වලට ඇතුළත් වන පරිපාලන දිස්ත්‍රික්ක සඳහා "සමානුපාතික නියෝජන" ඡන්ද විමසීම් ක්‍රමය අනුව සභිකයෝ තෝරාපත් කර ගනු ලැබූහ. පළාත් නවය සඳහා පරිපාලන දිස්ත්‍රික්ක 25න් පළාත් සභා සභිකයෝ 437ක් පත්කරනු ලැබිය යුතු වූහ. ඊට අමතරව 2017 වසර වනතුරු පළාත් සභාවක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා පළාත තුළ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ප්‍රසාද ආසන 02 බැගින් ලබාදීමෙන් සභිකයන් තවත් දෙදෙනෙකු එකතු කරන ලදී.

**6.1. පළාත් සභාවේ සභිකත්වය**

01. සෑම පළාත් සභාවක්ම 1987 අංක 47 දරන පළාත් සභා පනතේ 2 වන වගන්තියට අනුකූලව ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන සභික සංඛ්‍යාවකින් සමන්විත වේ. (2004 අංක 5 දරන පනතේ 2 වන වන්තිය යටතේ වන 3(1) උප වගන්තිය)

02. පළාත් සභා ඡන්ද විමසීම සඳහා මැතිවරණ කොට්ඨාස වශයෙන් සලකනු ලබන්නේ ඒ පළාත තුළ පවතින පරිපාලන දිස්ත්‍රික්කයන් ය.

03. පළාත් සභාව සඳහා ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කවලින් තෝරා පත්කරගත යුතු සභික සංඛ්‍යාව මැතිවරණ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන්නේ පහත දැක්වෙන පදනම මතය.

(අ) ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් 40,000කට එක් සභිකයෙකි. මේ සඳහා උපයෝගී කරගනු ලබනුයේ ඡන්ද විමසීමට පෙරාතුවම පවත්වන ලද ජන හා නිවාස සංගණනයෙන් හෙළි කෙරෙන ජන සංඛ්‍යාව ළඟම 40,000 ට සංයුක්ත වන ආකාරයට ගණන් ගැනීමෙනි.

(ආ) ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ ව.කි.මී.1000කට එක් සභිකයෙකි. මෙම ඡේදය සඳහා පරිපාලන දිස්ත්‍රික්කයේ භූමි ප්‍රදේශය සංයුක්ත වන ආකාරය සැලකිල්ලට ගනු ලැබේ.












එසේ වුව ද මේ උපවගන්තිය ප්‍රකාර කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන මන්ත්‍රීන් සංඛ්‍යාව, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 2 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට අනුරූපව උක්ත පනතේ 61 අ වගන්තියේ 2 වන උප වගන්තිය යටතේ තෝරාගනු ලැබිය යුතු යයි ප්‍රකාශයට පත්කරනු ලබන මන්ත්‍රීන්ගේ සංඛ්‍යාවට වඩා දෙදෙනෙකුගෙන් අඩු සංඛ්‍යාවක් විය යුතු ය. (2004 අංක 5 දරන පනතේ 2 වගන්තිය යටතේ වන 3 (3) (ආ) උප වගන්තිය)

කිසියම් පළාතක පළාත් සභා පිහිටුවීම සඳහා පැවැත්වෙන ඡන්ද විමසීමක් සඳහා එම පළාත තුළ පවතින පරිපාලන දිස්ත්‍රික්ක මැතිවරණ කොට්ඨාස වශයෙන් ගණන් ගනු ලබන හෙයින් මෙහිලා මැතිවරණ කොට්ඨාස සඳහා වූ සීමා නිර්ණය කිරීමක් අදාළ වන්නේ නැත. පළාත් සභාවක මුළු මන්ත්‍රී සංඛ්‍යාව (පළාත් සභාවට අදාළ ප්‍රසාද ආසන දෙක ද සහිතව) බස්නාහිර පළාත් සභාවට 104කි; මධ්‍යම පළාත් සභාවට 58කි; දකුණු පළාත් සභාවට 55කි; උතුරු පළාත් සභාවට 38කි; නැගෙනහිර පළාත් සභාවට 37කි; උතුරුමැද පළාත් සභාවට 33කි; ඌව පළාත් සභාවට 34කි; සබරගමුව පළාත් සභාවට 44 කි.

ප්‍රථම වතාවට පළාත් සභා ඡන්ද විමසීමක් පවත්වන ලද්දේ උතුරු මැද, වයඹ, සබරගමුව හා ඌව යන පළාත් සඳහා 1988 අප්‍රේල් 28 දිනදී ය.

2012 පවත්වන ලද ජන හා නිවාස සංගණනය පදනම් කොට ගෙන ඒ ඒ දිස්ත්‍රික්කවලට වෙන්කර දෙන ලද මන්ත්‍රීන් සංඛ්‍යාව (ප්‍රසාද ආසන 2 හැර)

| | |
|---|---|
| කොළඹ ---------- 40; | ගම්පහ ------ 40; |
| කළුතර ---------- 22; | මහනුවර ---- 29; |
| මාතලේ ----------- 11; | නුවරඑළිය ---16; |
| ගාල්ල ----------- 22; | මාතර --------17; |
| හම්බන්තොට -----17; | යාපනය ----16; |
| කිළිනොච්චි ------ 04; | මන්නාරම --- 05; |
| වවුනියාව -------- 06; | මුලතිව් ----- 05; |
| මඩකලපුව -------- 11; | අම්පාර -------14; |
| ත්‍රිකුණාමලය ------10; | කුරුණෑගල - 34; |
| පුත්තලම ---------16; | අනුරාධපුර ---21; |
| පොළොන්නරුව --10; | බදුල්ල -------18; |
| මොණරාගල ------14; | රත්නපුර ---- 24; |
| කෑගල්ල ----------18; | |

### 6.2. 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත

2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත නව මිශ්‍ර (කේවල/ සරල බහුතරය හා සමානුපාතික නියෝජනය) ක්‍රමයේ මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දුණි. මෙහි දී පරිපාලන දිස්ත්‍රික්කයක මන්ත්‍රී සංඛ්‍යාවෙන් 50% ක් සරල බහුතරය අනුව කේවල මන්ත්‍රී ධුර සංඛ්‍යාවකට තෝරාපත් කර ගනු ලබන අතර සෙසු 50% දිස්ත්‍රික්ක මට්ටමේ සමානුපාතික නියෝජන ක්‍රමයට (අතිරේක සහික ලැයිස්තුවෙන්) තෝරාපත් කර ගනු ලැබේ.

### 7.0. 2017 වර්ෂයේ පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම.

අදාළ පනත්වල විධිවිධානයන්ට අනුකූලව ජනාධිපතිවරයා විසින් පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ වගකීම පවරමින් පස්දෙනෙකුගෙන් සමන්විත සීමා නිර්ණය කමිටුව 2017.10.04 දින පත් කරන ලදී. 2017 සංශෝධන පනතින් සංශෝධනය කරන ලද මූලික පනතේ 3 අ (1) සිට 3 අ (11) දක්වා වූ වගන්තියෙන් මෙම කමිටුවට නෛතික බලය ප්‍රදානය කර ඇත.

### 7.1. පරිපාලන දිස්ත්‍රික්ක 25 තුළ පවත්නා පළාත් සභා මැතිවරණ කොට්ඨාස

මැතිවරණ කොමසාරිස්වරයා විසින් පසුගිය 2012 ජන හා නිවාස සංගණනය හා දිස්ත්‍රික්කවල භූමි ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් ඒ ඒ දිස්ත්‍රික්ක සඳහා පත් කළ යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තීරණය කරන ලදී. ඒ ඒ දිස්ත්‍රික්කවල මැතිවරණ කොට්ඨාස පදනම් කොට ගෙන මන්ත්‍රීවරුන් 50%ක් තෝරාපත් කර ගත යුතු ආකාරය තීරණය කිරීම සීමා නිර්ණය කමිටුව සිදු කළ යුතු විය. එම සංඛ්‍යාව ගණනය කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවලින් තෝරාපත් කර ගත යුතු මන්ත්‍රී සංඛ්‍යාව දෙකෙන් බෙදන ලදී. දිස්ත්‍රික්ක 25න් 18ක එසේ ගණනය කරන ලද මන්ත්‍රීන් සංඛ්‍යාවන් පූර්ණ සංඛ්‍යාවන් විය. ඉතිරි දිස්ත්‍රික්ක 7හි සංඛ්‍යාවන් පූර්ණ සංඛ්‍යා හා සංඛ්‍යා භාගයන් වූ විට අඩවටැයීමේ ක්‍රමයට අනුකූලව සහික සංඛ්‍යාව ඊළඟ ඉහළම පූර්ණ සංඛ්‍යාවට වටයන ලදී.

ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා තෝරාගත යුතු මන්ත්‍රී සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| කොළඹ ---------- 20; | ගම්පහ ------ 20; |
| කළුතර ----------- 11; | මහනුවර -----15; |
| මාතලේ ---------- 06; | නුවරඑළිය -- 08; |
| ගාල්ල ------------ 11; | මාතර ------- 09; |
| හම්බන්තොට ---- 07; | යාපනය --- 08; |
| කිළිනොච්චි ------ 02; | මන්නාරම --- 03; |
| වවුනියාව --------- 03; | මුලතිව් ----- 03; |
| මඩකලපුව ------ 06; | අම්පාර------ 07; |
| ත්‍රිකුණාමලය ----- 05; | කුරුණෑගල --17; |
| පුත්තලම -------- 08; | අනුරාධපුර--- 11; |
| පොළොන්නරුව - 05; | බදුල්ල ------ 09; |
| මොණරාගල ----- 07; | රත්නපුර -----12; |
| කෑගල්ල --------- 09; | |

සම්පූර්ණ සංඛ්‍යාව - 222කි.

### 7.2. සීමා නිර්ණය ක්‍රියාවලිය


සීමා නිර්ණය කමිටුව විසින් මෙම විෂයය පිළිබඳව උනන්දුවක් දක්වන දේශපාලන පක්ෂ, මහජන සංවිධාන හා මහජනතාවගෙන් ලිඛිත අදහස් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. දිස්ත්‍රික්ක 25හි ම මහජන අදහසට සවන්දීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී. මෙම කාලසීමාව තුළ කමිටු සාමාජිකයෝ දිවයිනේ දිස්ත්‍රික්ක 24කට ගොස් ඇත්තාහ. වාර්තාව සම්පාදනය කිරීම සඳහා කමිටුව මහජනතාවගෙන් මෙන් ම ආගමික නායකයන්ගෙන් ද අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී. මහජන අදහස් ලබා ගැනීම සඳහා කමිටුව ඒ ඒ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට පැමිණෙන වේලාවන් කල් වේලා ඇතිව මහනජතාවට දැනුම් දැනුම් දෙන ලදී. කමිටුවට පැවරී තිබුණු වගකීම ඉටු කිරීම සඳහා ප්‍රතිචාර 678ක් (ලිඛිත හා වාචික) ලැබුණි. කමිටුව විසින් 50% ක් සහිකයන් සරල බහුතරය අනුව පළාත් 09 සඳහා තෝරා ගැනීමටත්, පළාත් සභා සඳහා 222ක් වූ මැතිවරණ කොට්ඨාස බිහි කිරීමටත්, උචිත වන ආකාරයට ඉදිරිපත්ව තිබුණු අදහස් හා යෝජනා සාකච්ඡා කොට උචිත යෝජනා වාර්තාවට ඇතුළත් කරන ලදී.

2017 සංශෝධන පනත අනුව සංශෝධනය කරන ලද ප්‍රධාන පනතේ 3 අ (11) වගන්තියට අනුකූලව 3 අ (11) වගන්තිය අනුව ඉදිරි කටයුතු කිරීම සඳහා සීමා නිර්ණය කමිටුව විසින් 2018 පෙබරවාරි 19 වන දින සිය වාර්තාව පළාත් පාලන හා පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වෙත භාරදෙන ලදී.

පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය පිළිබඳව විවිධ පාර්ශව විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත හා වාචික අදහස් හා යෝජනා පිළිබඳ දිස්ත්‍රික්ක අනුව කෙරෙන විග්‍රහයක් සීමා නිර්ණය වාර්තාවෙහි ඇතුළත්වන අතර, පරිපාලන දිස්ත්‍රික්ක මැතිවරණ කොට්ඨාස වශයෙන් හඳුනා ගැනීමේ දී කමිටුව සැලකිල්ලට ගත් සාධක ඊට ඇතුළත් කොට තිබේ. එක් එක් පළාත වෙනුවෙන් වූ පරිච්ඡේදවල ඒ ඒ දිස්ත්‍රික්කවල අංක, නම්, ජනගහණ සංඛ්‍යා හා අන්තර්ගත කොට්ඨාස යන කරුණු සාරාංශ ගත කර තිබේ. විවිධ පාර්ශවකරුවන් විසින් අවධාරණය කරන ලද කාරණා සහ කමිටුවේ ප්‍රතිචාර ද ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා අනාගතයේ දී සැලකිල්ලට ගත යුතු කරුණු ද මෙම වාර්තාවෙහි තවදුරටත් අන්තර්ගත කොට ඇත.









06 වන පිටුවෙන්...

## ලංකාවේ ඡන්දහිමියන් ගණන් ගැනීම හා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ විකාශනය......

**ලිඛිතව ගණන් ගන්නා නිලධාරීට භාරදීම වෙනුවෙන් ලදුපතක් ගෘහ මූලිකයාට භාරදීම**

වාර්ෂිකව ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගණන් ගන්නා නිලධාරී විසින් ගෘහ මූලිකයාට භාරදෙනු ලබන ආකෘති පත්‍රය සම්පූර්ණ කොට ආපසු භාරදීමෙන් පසු, ඒ බව සනාථ කිරීම සඳහා ලදු පතක් එම නිලධාරියා විසින් ගෘහ මූලිකයාට භාරදිය යුතු බව 1996 වර්ෂයේ දී තීරණය කරන ලදී. මෙය ගෘහ මූලිකයාට මෙන් ම ගණන් ගන්නා නිලධාරියාට ද සිය වගකීම් ඉටු කරන ලද බව සනාථ කිරීම සඳහා සුදුසු සාක්ෂියක් විය.

**(16.) 1983 සිට උතුරු හා නැගෙනහිර පළාත්වල ඡන්දහිමියන් ගණන් ගැනීම**

1980 දශකයේ ආරම්භයේ සිට උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති අයහපත් වාතාවරණය නිසා එම ප්‍රදේශවල සිවිල් පරිපාලන කටයුතු අඩාල වීම මෙන්ම, ජනතාවගේ අවතැන් වීම් ද විශාල වශයෙන් සිදු විය. මේ නිසා ඡන්දහිමියන් ගණන් ගැනීමට අපහසු වූ ප්‍රදේශවල ඡන්දහිමි නාමලේඛනය සකසන ලද්දේ පූර්ව වර්ෂයේ ලියාපදිංචි ඡන්දහිමියන්ගේ නම් ඊළඟ වර්ෂය වෙනුවෙන් ද නාමලේඛන ගත කිරීම මගිනි. මෙම තත්වය යටතේ සාමාන්‍ය පරිදි ඡන්දහිමියන් ගණන් ගැනීමේ කටයුතු ආරම්භ වුයේ එම ප්‍රදේශවල සිවිල් පරිපාලන කටයුතු ප්‍රතිෂ්ඨාපනය කිරීම, පුද්ගලයින් නැවත මුල් පදිංචි ස්ථානවල පදිංචි වීමේ ප්‍රගතිය හා එම ප්‍රදේශවල ආරක්ෂාව සහතික වීම යනාදී කරුණු අනුව ය. මෙම තත්ත්වය 1980 සිට 2010 පමණ දක්වා කාලය තුළ ප්‍රකාශයට පත් කරන ලද මැතිවරණ කොමසාරිස්වරයාගේ වාර්ෂික වාර්තාවල සඳහන් කොට ඇත.

**සමාප්තිය**

ලංකාවේ මැතිවරණ ක්‍රම ආරම්භ වූ 1911 වර්ෂයේ සිට මේ දක්වා, ඡන්දහිමියන් ගණන් ගැනීමේ නීතිය හා ඊට අදාළ ක්‍රියාවලිය පමණක් සැකවින් විස්තර කිරීමට අදහස් කළ බැවින් මාතෘකාවට අදාළ ප්‍රධාන කරුණු පමණක් සාරාංශ කොට දක්වන ලද බව සඳහන් කරනු කැමැත්තෙමි.

# වාර්ෂික ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය

- ග්‍රාම නිලධාරී හා විශේෂ ගණන් ගන්නා නිලධාරීවරුන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් උපදෙස් පන්ති පැවැත්වීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමේ වැදගත්කම පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ පුළුල් ප්‍රචාරයක් ලබාදීම. විශේෂයෙන්ම ලංකාවේ සියලුම ජංගම දුරකථන ග්‍රාහකයන් වෙත කෙටි පණිවුඩයක් (SMS) මගින් දැනුම්වත් කිරීම, පුවත්පත් දැන්වීම් පළ කිරීම, කෙටි වීඩියෝ වැඩසටහන් ප්‍රචාරය කිරීම.
- ඡන්ද හිමියන් ගණන් ගන්නා ආකෘති (බී.සී. ආකෘති) ලංකාවේ සියලුම නිවෙස් වෙත/ ගෘහ මූලිකයන් වෙත භාරදීම.
- ඡන්දහිමියන්ගේ දින උත්සව/ වැඩසටහන් පවත්වමින් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමේ වැදගත්කම පිළිබඳව පුළුල් ප්‍රචාරයක් ලබා දීම.
- නිසි ලෙස සම්පූර්ණ කරන ලද බී.සී. ආකෘති පත්‍ර ග්‍රාම නිලධාරී විසින් හා ගණන් ගන්නා නිලධාරී විසින් නිවෙස් හිමියන්ගෙන් භාර ගැනීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් විය යුතු නම්වල වෙනස්කම් සටහන් කර ගැනීම හා ගණන් ගන්නා නිලධාරීන්/ ග්‍රාම නිලධාරීවරුන් නිර්දේශ නොකරන ලද නම් සඳහා ලිපි යැවීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි නොවූ අයගේ පැමිණිලි භාර ගැනීම. මේ සඳහා UE ආකෘතිය, ලිපි මඟින් කරන ඉල්ලීම් හා විද්‍යුත් තැපෑල භාවිතා කළ හැකිය.
- පසුගිය වර්ෂයේ නාමලේඛනයෙන් ඉවත්වන නම් (අ ලැයිස්තුව) සහ ඉදිරි වර්ෂයේ නාමලේඛනයට ඇතුළත් වන නම් (ආ ලැයිස්තුව) සඳහන් ලේඛන සකස් කිරීම හා ඒවා නැවත පරීක්ෂා කිරීම.
- ද්විත්ව ලියාපදිංචියට අදාළව තීරණ ගැනීම සඳහා අදාළ අය වෙත ලිපි යැවීම, පිළිතුරු ගෙන්වා ගැනීම හා ඒ පිළිබඳව අවශ්‍ය තීරණ ගැනීම.
- “අ” හා “ආ” ලැයිස්තු සියලුම ග්‍රාම නිලධාරී කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ප්‍රදර්ශනය කිරීම ආරම්භ කිරීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට නොහැකි වූ අයගේ හිමිකම් ඉල්ලීම් භාර ගැනීම.
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සම්බන්ධව නියමිත ආකෘතිය යටතේ ඉදිරිපත්වන විරෝධතා දැක්වීම් භාර ගැනීම.
- 2018 වර්ෂය සඳහා ඡන්දහිමි නාමලේඛනයට මේ දක්වා ඇතුළත් නොවූ සෙසු පුරවැසියන් නැවතත් කෙටි පණිවුඩයක් (SMS) මගින් දැනුම්වත් කිරීම.
- ලැබී තිබෙන හිමිකම් හා විරෝධතා පිළිබඳව කාර්යාලගත හා අදාළ වන පරිදි ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම.
- හිමිකම් හා විරෝධතා පරීක්ෂණවල තීරණ අනුව ඡන්දහිමි නාමලේඛනයට නම් ඇතුළත් කිරීම/ ඉවත් කිරීම, බී.සී. ආකෘති අනුව නම් පරීක්ෂා කිරීම, ජාතික හැඳුනුම්පත් අංකවල හා නම්වල අඩුපාඩු සකස් කිරීම.
- හිමිකම් විරෝධතා තීරණ අනුව ද්විත්ව ලියාපදිංචියට අදාළ කටයුතු.
- කෙටුම්පත් නාමලේඛනය සියලුම ග්‍රාම නිලධාරී කාර්යාල හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ප්‍රදර්ශනය කිරීම.
- වාර්ෂික ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම.







# ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2018

ශ්‍රීන් යාපා බොරලැස්ස
සහකාර මැතිවරණ කොමසාරිස් (පාර්ලිමේන්තු මැතිවරණ)

සුදුසුකම්ලත් සියලු පුරවැසියන්ගේ ඡන්ද අයිතිය සුරැකීම උදෙසා 2018 වසරේදී ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය මේ වන විට සිදුකරමින් පවතී. මෙවර ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට සමගාමීව පුරවැසියන් හට ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමේ වැදගත්කමේ පණිවුඩය ලබාදීම උදෙසා ඡන්ද හිමියන්ගේ දිනය සැමරීමේ වැඩසටහන් දිවයිනේ සෑම පළාතක්ම ආවරණය වන පරිදි පවත්වන ලදී. මෙවර ඡන්ද හිමියන්ගේ දිනයෙහි තේමාව වූයේ **"සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ඡන්ද බලය මත රඳා පවතී"** යන්නයි.

## 2018 ඡන්ද හිමියනගේ දිනය සැමරීමේ වැඩසටහන්

2018.06.01 - **කෑගල්ල දිස්ත්‍රික්කය**
මෙවර ඡන්ද හිමියන්ගේ දින සැමරුමේ ඉතා සුවිශේෂි වැඩසටහනක් වූයේ ඉතිහාසයේ ප්‍රථම වතාවට උඩරට දුම්රියෙහි කොළඹ කොටුව සිට බදුල්ල දක්වාම ගමන් ගත් දුම්රිය මගින් ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමේ වැදගත්කම පිළිබඳව දැනුම්වත් කිරීම නිසාවෙනි. දුම්රියේ ගමන්ගත් මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය රඹුක්කන දුම්රිය ස්ථානයෙන් බැස එහි සිට ප්‍රදර්ශනාත්මක රථ පෙළපාලියක් මඟින් ජනතාව දැනුම්වත් කරමින් කෑගල්ල නගරයට පැමිණ කෑගල්ල නගරයේදී පාගමනින් ජනතාව දැනුම්වත් කරමින් පැමිණ කෑගල්ල නගර ශාලාවේදී ජනතා දැනුම්වත් කිරීමේ ප්‍රධාන රැස්වීම මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

2018.06.04 - **මොණරාගල දිස්ත්‍රික්කය**
මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට සියලුම පාර්ශවකාර කණ්ඩායම් හා පාසල් ළමුන් ඇතුළත් පෙළපාලියකින් පැමිණ නගර සභා ශාලාවේ දී පැවති ඡන්ද හිමියන් දැනුම්වත් කිරීමේ වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම්තුමා ඇතුළු නිලධාරින් සහභාගි විය.

2018.06.05 - **පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පැවති වැඩසටහන**
විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව සඳහා ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ වැදගත්කම පිළිබඳව දැනුම්වත් කිරීමේ අරමුණින් පැවති මෙම වැඩසටහන මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු නිලධාරින් සහභාගී විය.

2018.06.07 - **කළුතර දිස්ත්‍රික්කය**
කළුතර දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ හා ප්‍රත්‍යන්ත ගම් හරහා ගමන් කරන ලද ප්‍රදර්ශනාත්මක රථ පෙළපාලියක් මගින් හා ප්‍රධාන රැස්වීමක් පවත්වා කළුතර දිස්ත්‍රික්කයේ ජනතාව දැනුම්වත් කරන ලදී. මෙම උත්සවය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා හා සමාජික ජනාධිපති නිතිඥ නලින් අබේසේකර මහතා ඇතුළු නිලධාරීන් මෙම වැඩසටහනට සහභාගී විය.

2018.06.07 - **යාපනය දිස්ත්‍රික්කය**
උතුරු පළාතේ වාසය කරන ජනතාව දැනුම්වත් කිරීම සඳහා යාපනය නගර මධ්‍යයේ සංවිධානය කල පාගමනට හා රැස්වීමට මැතිවරණ කොමිෂන් සභාවේ සමාජික මහචාර්ය රත්නජීවන් එච් හූල් මහතා ඇතුළු නිලධාරීන් සහභාගී විය.

2018.06.08 **අනුරාධපුරය දිස්ත්‍රික්කය**
උතුරු මැද පළාත් ජනතාව දැනුම්වත් කරනු වස් මැදවච්චිය නගරයේ පැවති පෙළපාලිය හා රැස්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු නිලධාරීන් සහභාගි විය.


2018.06.12 - **මාතර දිස්ත්‍රික්කය**
මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශයේ වතු ආශ්‍රිත ප්‍රජාව හා අනෙකුත් ජනතාව දැනුවත් කිරීම සඳහා මහජන පෙළපාලියක් ද පසුව සියළුම පාර්ශවකාර කණ්ඩායම් ඇතුළත් රැස්වීමක් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

2018.06.23 - **අම්පාර දිස්ත්‍රික්කය**
නැගෙනහිර පළාත් ජනතාව දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය රත්නජීවන් එච් හූල් මහතාගේ ප්‍රධානත්වයෙන් අග්නිදිග විශ්වවිද්‍යාල ශිෂ්‍ය ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පැවැත්වුණු අතර දිස්ත්‍රික්කයේ පැවති සෙසු වැඩසටහන් සඳහා අතිරේක මැතිවරණ කොමසාරිස්වරු ප්‍රමුඛ නිලධාරීන් සහභාගී විය.

2018.06.25 - **පුත්තලම දිස්ත්‍රික්කය**
කල්පිටිය ප්‍රදේශයේ ප්‍රජාව දැනුම්වත් කිරීම සඳහා මහජන හා රථ පෙළපාලියක් ද පසුව සියළුම පාර්ශවකාර කණ්ඩායම් ඇතුළත් රැස්වීමක් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතාගේ හා සමාජික මහාචාර්ය රත්නජීවන් එච් හූල් මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

2018.07.03 - **මාතලේ දිස්ත්‍රික්කය**
මාතලේ දිස්ත්‍රික් ජනතාව දැනුම්වත් කිරීම සඳහා මහජන හා රථ පෙළපාලියක් ද පසුව සියළුම පාර්ශවකාර කණ්ඩායම් ඇතුළත් රැස්වීමක් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

2018.08.06 - **කොළඹ දිස්ත්‍රික්කය**
කොළඹ දිස්ත්‍රික්කයෙන් පළාත් පාලන ආයතන සඳහා තේරිපත් වූ කාන්තා නියෝජිතයින් දැනුම්වත් කිරීමේ වැඩසටහන මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා හා සාමාජික මහාචාර්ය රත්නජීවන් එච් හූල් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.




2012 වසරේ සිට ඇරඹි මෙම ඡන්ද හිමියන්ගේ දින වැඩසටහන්වල මුඛ්‍ය අරමුණ වූයේ ඡන්දහිමි නාමලේඛණයේ



ලියාපදිංචි වීමේ වැදගත්කම පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමයි. මෙවැනි දැනුම්වත් කිරීම් හා මැතිවරණ කොමිෂන් සභාව විසින් දියත් කර ඇති විවිධ අධ්‍යාපනික වැඩසටහන් හේතුවෙන් පසුගිය වර්ෂවල ඡන්ද හිමියන් ලියාපදිංචි වීමේ ක්‍රමික වර්ධනයක් දැකගත හැකිය.

## 2018 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය යටතේ ක්‍රියාත්මක කළ සුවිශේෂී වැඩසටහන්

- **නව බීසී ආකෘතියක් හඳුන්වා දීම.**
වර්තමානයේදී භාවිතා වන බීසී ආකෘතිය (ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ ආකෘතිය) ප්‍රමාණයෙන් විශාල බැවින් එය පරිහරණය කිරීමේදී හා සම්පූර්ණ කිරීමේදී යම් අපහසුතා පවතින බැවින් එම ආකෘතිය වෙනස් කිරීම කාලෝචිත බව ග්‍රාම නිලධාරී සංගම් හා මහ ජනතාව විසින් කරන ලද ඉල්ලීම් සලකා බැලූ මැතිවරණ කොමිෂන් සභාව නව බීසී ආකෘතිය හඳුන්වාදීමේ මූලික පියවර ලෙස දිවයිනේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 14ක නියමු ව්‍යාපෘතියක් සිදුකරන ලදී. එම ග්‍රාම නිලධාරී කොට්ඨාස පහත පරිදි විය.

| දිස්ත්‍රික්කය | ග්‍රාම නිලධාරී කොට්ඨාසය |
|---|---|
| කොළඹ | 505-B දොඩන්ගහහේන |
| ගම්පහ | 97 දිවුලපිටිය |
| | 160 උඩයාර්තොප්පුව |
| කළුතර | 615-F වෑවල බටහිර |
| | 730 වෙට්ටුමකඩ දකුණ |
| | 618-C පෝරාවදඬුව බටහිර |
| මහනුවර | 1075 ඇත්ගාල බටහිර |
| | 246 ඔගස්ටාවත්ත |
| | 254 මල්වත්ත |
| ගාල්ල | 98-A මඩවලමුල්ල උතුර |
| | 25-K පූජාගල්ලෙන |
| කුරුණෑගල | 1459 බිංගිරිය |
| පුත්තලම | 497-A නැගෙනහිර තුම්මෝදර |
| බදුල්ල | 67-F වටගමුව |
| කෑගල්ල | 37-A වඩුවාවල උතුර |

මෙම නියමු ව්‍යාපෘතිය ඉතා සාර්ථක වූ අතර ජනතාවගෙන් හා ග්‍රාම නිලධාරීවරුන්ගෙන් නව බීසී ආකෘතියට ප්‍රසාදය දක්වා තිබුණි. එම ආකෘතිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ අදහස් හා යෝජනා ද ලබාදී ඇත. මේ සියලු කරුණු කාරනා සැලකිල්ලට ගෙන මෙම නව බීසී ආකෘතිය ඉදිරියේදී දිවයින පුරා නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා යොදා ගැනීමේ හැකියාව සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව සොයා බලමින් පවතී.

ඡන්ද හිමි නාමලේඛන සැකසීමේ දී මගහැරෙන ජන කොටස් ලියාපදිංචි කිරීම පිළිබඳව මෙවර ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී වැඩි අවධානයක් යොමු වූ අතර සුදුසුකම් ලත් සියළු පුරවැසියන් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීම සම්බන්ධව පහත පරිදි විශේෂ වැඩසටහන් දියත් කරන ලදී.

- **කුලී පදනම මත හා බදු පදනම මත වාසය කරන ජනතාව**
මෙම ජනතාව ලියාපදිංචි කිරීම සඳහා ඔවුන් වාසය කරන කුලී නිවාස හා බදු නිවාස "R" ලෙස විශේෂ සංකේතයක් යොදා ලියාපදිංචි කිරීම. මෙමගින් මෙම ජනතාව ලියාපදිංචි කිරීම සඳහා එකී නිවාසවල අයිතිකරුවන් දක්වන අකමැත්ත වලක්වා ගැනීමට හැකි වී ඇත.

- **විදේශගත පුද්ගලයන්**
තාවකාලිකව රැකියා කටයුතු හෝ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් විදේශගතව වාසය කලද ලියාපදිංචිය සඳහා සුදුසුකම් සපුරාලන්නේනම් මෙරට සාමාන්‍ය පදිංචිය තිබූ ලිපිනය යටතේ ලියාපදිංචිය සඳහා කටයුතු කර ඇත.

- **අභිකුණ්ඨක ජනතාව ලියාපදිංචි කිරීම**
අභිකුණ්ඨක ජනතාව ලියාපදිංචි කිරීම සඳහා ඔවුන්ගේ වාසස්ථාන පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු ලබාගත් අතර එම තොරතුරු මත ඔවුන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කර ඇත.

- **වතු ආශ්‍රිත ප්‍රදේශවල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම.**
වතු නිවාසවල පදිංචි එහෙත් අදාළ වත්තේ සේවයේ යෙදී නොසිටින වෙනත් ප්‍රදේශවල රැකියා කරන ජනතාව ලියාපදිංචි කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් යොදන ලදී.

- **වැඩිහිටි නිවාසවල හා රැඳවුම් කඳවුරුවල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම.**
මෙම ජනතාව පූර්ව පදිංචි ස්ථානවල හෝ වැඩිහිටි නිවාස තුළම ලියාපදිංචි කිරීමට කටයුතු යොදා ඇත.

- **රැකියා සඳහා ගම් ප්‍රදේශවලින් බැහැරව නාගරිකව වෙසෙන ජනයා තාවකාලිකව පදිංචිව සිටින ස්ථානවල ලියාපදිංචි කිරීම.**

- **ඡන්ද හිමියන් ගණන් ගන්නා ආකෘති පත්‍රය ගෘහමූලික වෙත ලැබීම සම්බන්ධ සමීක්ෂණය**
ඡන්ද හිමියන් ගණන් ගන්නා ආකෘති (බීසී) පත්‍රය ජනතාව වෙත නිසි පරිදි නොලැබෙන බවට ලැබෙන පැමිණිලි සඳහා මැතිවරණ කොමිෂන් සභාව ඒ සම්බන්ධව දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සමීක්ෂණයක් සිදුකරන ලදී. එමගින් අනාවරණය වන තොරතුරු මත ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට මැතිවරණ කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

- **SMS පණිවුඩ මගින් දැනුම්වත් කිරීම.**
ඡන්ද හිමියන් ගණන් ගැනීමේ ආකෘති ජනතාව වෙත ලබාදීම සම්බන්ධව හා තම නම ඡන්ද හිමි නාමලේඛනයේ මූලික ලැයිස්තුවල තිබේදැයි පරීක්ෂා කර බලන ලෙස දක්වා ජනතාව දැනුම්වත් කිරීමේ SMS පණිවුඩ 02ක් සියලු ජංගම දුරකථන භාවිත කරන ජනතාව වෙත ලබාදී ඇත.

- **කෙටි වීඩියෝ චිත්‍රපට ප්‍රචාරය කිරීම.**
ඡන්ද හිමිනාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය හා ලියාපදිංචි වීමේ වැදගත්කම අලලා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් නිෂ්පාදනය කරන ලද කෙටි වීඩියෝ චිත්‍රපටයක් ප්‍රතිශෝධන කාල සීමාව තුළ සියළුම රූපවාහිනී නාලිකාවල විකාශය කරන ලදී.

මෙම සියළුම නවෝත්පාදන ව්‍යාපෘති ඉතාම සාර්ථක ක්‍රමවේද වූ බව ලැබෙන ප්‍රතිචාර තුළින් පැහැදිළි වේ.

## 2018 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලියේදී මේවන තෙක් පහත කාලසටහනට අනුරූපිව සිදුකර ඇත.

2018.06.01
ඡන්ද හිමියන් ගණන් ගැනීම ආරම්භය
2018.06.04-2018.08.08
ඡන්ද හිමියන් ගණන් ගන්නා ආකෘති ගෘහමූලිකයින් වෙතින් ආපසු භාරගැනීම.
2018.07.23-2018.08.09
ලියාපදිංචි නොවූ අයගේ පැමිණිලි, UE ආකෘති හා E- mail භාර ගැනීම.
2018.08.10-2018.09.08
"අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය
2018.08.10-2018.09.08
හිමිකම් හා විරෝධතා ඉල්ලීම්

මේ සියලු කටයුතු අවසන් කර ඔක්තෝබර් මසදී 2018 ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ සේවය කරන සියළුම සේවක සේවිකාවන් විසින් ජනතාවගේ ඡන්ද අයිතිය සුරැකීම සඳහා දිවා රෑ නොතකා වෙහෙසෙමින් 2018 ඡන්ද හිමි නාමලේඛනය සැකසීම සඳහා කටයුතු කරති. ඔවුන් සියළුදෙනාවෙත මැතිවරණ කොමිෂන් සභාවේ කෘතඥතා පූර්වක ස්තූතිය හිමිවේ.





# හිමි අහිමි

**ධරණී උපේකා වීරසේකර**
**සහකාර මැතිවරණ කොමසාරිස් (නීති)**

අවුරුදු විසි අටක් ගෙවී ගොසින් ය. ජීවිතය යනු විටෙක සෙමින් ගලා බසින ගඟුලකි; විටෙක සැඩ සමුදුරකි. ඔරලෝසුවේ පහේ කණිසම නාද විය. අවසාන ලියුම ද අත්සන් කළ මම ඒ මත නිල මුද්‍රාව තැබුවෙමි.

"උදුල හිමකර දිසානායක, සහකාර මැතිවරණ කොමසාරිස් (ත්‍රිකුණාමලය)" කඩදාසිය මත දම්පාට තීන්ත බොඳ වූ නිල මුද්‍රාවේ මුල් දෙපේළිය දෙස මම මොහොතක් බලා සිටියෙමි. මෙවැනි දේ නිතර සිදු වන්නේ නිල මුද්‍රාව ඕනෑවටත් වඩා තෙරපන හෙයිනි. බොඳ වූ තීන්ත කියා පාන්නේ තෙරපෙමින් මාගේ නමත් රැකියාවත් රැක ගැනීමට දරන මහත් පරිශ්‍රමය ම නොවේ ද?

මා හරිබරි ගැසී අසුනින් නැගිට නවාතැන වෙත යාමට සැරසුණා පමණි. පියසේන මගේ කුටියට එබුණේ ය.

"සර් හම්බවෙන්න කවුද තරුණ නෝනා කෙනෙක් ඇවිත්"

ඈතින් ඇසෙන මුහුදේ රළ බිඳෙන හඬත්, සවස්වන විට කෑදලි කරා ඇදෙන සියොතුන්ගේ නාදයත් හැරුණු කොට මේ නිහඬ පාලු කොටු පවුර තුළ වෙනත් කිසිදු ඝෝෂාවක් සවනත නොවැකේ. එහෙත් හදවතට සමීප අතීත සැමරුම් තවමත් මා රිදවන බව නොරහසකි. සෑම සවසකම හමුදා කඳවුර අසල ඇති තුරු වියන්වලින් සෙවන වූ මාවත දිගේ ඇවිද යන විට ඒ සොඳුරු එහෙත් වේදනා බර මතකයන් ම සිතට පාව එනුයේ නිරායාසයෙනි.

කොළඹ සිට බොහෝ දුර ගෙවා සිය කැමැත්තෙන් ත්‍රිකුණාමලයේ සේවය කිරීමට පැමිණීමට මා පෙළඹ වූ හේතුව ද ඒ අතීත ස්මරණයෙන් මිදීමේ නොනිත් ආසාවෙනි. අප්‍රිය සම්ප්‍රයෝග යේ දුකට වඩා ප්‍රිය විප්‍රයෝගයේ දුක හදවත දවාලයි.

"මොකට ද ඒ නෝනා ඇවිත් ඉන්නෙ කියලා කිව්වේ නැද්ද?" මම පියසේනගෙන් ඇසුවෙමි.

"සර්වම හම්බවෙලා උපදේශයක් ගන්න ඕනැලු"

"එන්න කියන්න"

දොර විවර වන හඬත් සමඟ මගේ දෙනෙත් ඒ වෙත යොමු වූයේ නිතැතිනි. දෙවියනේ ඒ ඇස්! "ලෝචනා ඉන්දීවරී සමරදිවාකර" ඇයගේ නම මගේ මුවින් හඬ නඟා ගිලිහුණි.

එහෙනම් ඔයා මාව අඳුන ගත්තා.

මා ඇයව අනිවාර්යයෙන්ම හඳුනා ගත යුතු නොවේ ද. කලකට පෙර බාලිකාවන් දහසක් අතර ඇයව වෙන් කර හඳුනා ගැනීමේ හැකියාව මා සතු විය. කුමක් හෝ සැඟවුණු වේදනාවක් කැටි වූ දිගු දෙනෙත් ද, ඇයගේ මද සිනහව ද, වළ ගැසෙන දකුණු කම්මුල ද, දිගු වරලස ද තවමත් ඒ අයුරින් ම මට මතක ය.

සරසවියේ සිට නිවාඩුවට පැමිණි විට ඇය සමඟ කෝනේශ්වරම් ගිය සැටි, නිලාවැලි මුහුදු වෙරළෙහි වරු ගණන් පෙම් බස් තෙපලූ සැටි යන මේ කිසිවක් මගේ මතකයෙන් වියැකී නොමැත. එවකට රැකියා විරහිත දුගී උපාධිධාරියෙකු වූ මට ඇයගේ දෙමාපියන්ගෙන් එල්ල වූ බලවත් විරෝධය උහුලා ගත නොහැකි විය. කඳුළු සලමින් ඇය මගෙන් සමුගත් දිනය ද වේදනාවේ අළු පැහැය තැවරූ සිතුවමක් සේ මගේ සිත් බිතෙහි නොමැකී තිබේ.

"මොකද මේ හදිස්සියෙ මාව මතක් වෙලා" සිතේ කැකෑරුණු වේදනාව මම වචනවලින් දමා ගැසුවෙමි.
"මම ලොකු ප්‍රශ්නයක ඉන්නේ හිමකර"

"ඒ කිව්වේ?"

"හිමිකම පිළිබඳ ප්‍රශ්නයක්"

ඇය අසන්නට යන පැනයට පිළිතුරු මට කටපාඩම් ය.

"මෙහෙමයි, දැනට ඔයාගෙ සාමාන්‍ය පදිංචිය තියෙන ලිපිනය යටතේ තමයි ඔයාව ඡන්දදායකයෙක් වශයෙන් ලියාපදිංචි කරන්නේ. ඔයා ඡන්ද කොළේ නැත්තනම් බී.සී. ෆෝම් එකේ ඔයාගෙ නම ලියලා ඒ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීට භාර දෙන්න ඕනැ. ඔයාගේ නම ලිපින දෙකක් යටතේ ඇතුල් වෙලා තියෙනවා නම් ඒ ලිපින දෙකටම අපි ලියුම් එවලා ඔයාගෙන් අහනවා කොයි ලිපිනය යටතේ ලියාපදිංචි වෙන්න ද කැමති කියලා"

හිමකර, මම අදහස් කළේ එහෙම හිමිකමක් ගැන නෙවෙයි. මං අයිති ඔයාට. මං ඒක දන්නවා. අන්තිමේ දී අපේ ගෙදරින් ඔයාට කැමැත්ත දුන්නා. අපේ ගෙදරින් කැමැත්ත ලැබෙන්න කල් ගියත් ඒ වෙද්දි ඔයාගේ අතේ මුද්දක් නොතිබුණු එක ගැන මං කාට ද ස්තුතිවන්ත වෙන්න ඕනෑ?

දෙසවන් අදහා ගත නොහැකිව මම තත්පර ගණනක් ගොළුව හුන්නෙමි. අවසානයේ මා පෙම් කළ තරුණිය මගේ බිරිඳ වනු ඇත.

**"මම දන්නේ එක දෙයයි ලෝචනා. ඔයත් හරියට ශ්‍රී ලංකාවේ පරමාධිපත්‍ය වගේ. අත්හළ නොහැක්කේ ය. අන්සතු කළ නොහැක්කේ ය."**



**උපදේශක මණ්ඩලය**
මහින්ද දේශප්‍රිය
ජනාධිපති නීතිඥ නලින් ජේ. අබේසේකර
මහාචාර්ය රත්නජීවන් එච්. හූල්
එම්.ඒ.පී.සී. පෙරේරා
එච්.එම්.ටී.ඩී. හේරත්
සමන් ශ්‍රී රත්නායක

**සංස්කාරක** - චන්න පී. ද සිල්වා
**පරිගණක පිටු සැකසුම** - අමිල ගමගේ
**මුද්‍රණ උපදේශකත්වය** - ජගත් චන්ද්‍රලාල් ද සිල්වා
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
**මුද්‍රණය** - රජයේ මුද්‍රණාලය
**ප්‍රකාශනය** - පර්යේෂණ හා සැලසුම් අංශය
මැතිවරණ කොමිෂන් සභාව

**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**
සංස්කාරක - කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.
(+94)0112868441-42-43
(+94)112868426
info@elections.gov.lk
www.elections.gov.lk
SriLankaElectionCommission
elecomsl
Election Commission of Sri Lanka
Election Commission of Sri Lanka

**මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ හෝ අදහස් ප්‍රකාශ නොවේ.**